2022 ඔක්තෝබර්
03 කාණ්ඩය 10 කලාපය
ISSN 25792369
ආධාරය රු:100/-

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට





ජීවිතේ අහිමි වුණු
මළ මිනිස්සුන් නොවී
තවත් එක ලස්සනම
හෙටක් වෙනුවෙන්
අපි
මේ කඳුළු ආදරෙන්
විඳිනවා සත්තයි
මහතුනේ

අපි හෙළපු කඳුළුවල
මීට වැඩියෙන් දුකක්
ගැබ් වෙලා තියෙනවා
සත්තයි....

# කඳුළු උරුම මව්බිමට කෙළිමඬලෙන් සිනාකැන්...

ගෙවුණු වසර කිහිපය පුරාම අපි රටක් ලෙස අසීමිතව පීඩනයට පත්ව සිටියෙමු. වසංගතය හමුවේ ජන ජීවිත ගණනාවක් අහිමි වන්නටද සමාජය තුළ බේදවාචකයක් නිර්මාණය වන්නටද විය. විදෙස්ගත ශ්‍රමිකයින්ගේ ජීවිත පවා අවදානම් සහ අසීරු තත්වයක පැවතිණි. තෙල්, ගෑස් නැතිව ජීවිතවලින් පවා වන්දි ගෙවමින් මහජනතාවට පෝලිම්වල කාලය ගත කිරීමට සිදු විය. ජීවිතයේ සතුට බලා සිටිද්දීම පැන ගොසිනි. විදෙස් රටවලින් ලබාගත් ණය ගෙවා ගැනීමට නොහැකිව රට අපකීර්තියට පත් වී තිබුණි.

එවැනි මොහොතක ඕස්ට්‍රේලියාව හා ශ්‍රී ලංකාව අතර පැවති T20 අවසාන තරඟයෙන් මෙන්ම සීමිත ඕවර් 50 තරඟාවලියෙන් ජයග්‍රහණය ලබමින් අපේ ක්‍රීඩකයින් හඬන මිනිසුන්ට සතුටු කඳුළු ගෙනාවේය. තෙල් පෝලිම්වල රස්තියාදු වෙමින් සිටි ජනතාව එම ජයග්‍රහණය හදවතින්ම වින්දේය. දකුණු ආසියානු මලල ක්‍රීඩා උලෙළේ දී යුපුන් අබේකෝන් දකුණු ආසියාවේ වේගවත්ම මිනිසා බවට පත්වෙමින් ලෝකය ඉදිරියේ අභිමානය එක් කළේය.

මහජනතාවට අරගලයේ බලාපොරොත්තු පූර්ණ ලෙසම දිනාගැනීමට නොහැකි වුවද එම දේශපාලන අලකලංචි මධ්‍යයේ පවා පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උලෙළ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සහභාගී වූහ. ක්‍රීඩකයින් ගණනාවක්ම තරඟය පසෙක දමා ජීවිතය සොයා පලායද්දී යුපුන් අබේකෝන්, දිලංක කුමාර, නෙත්මි අහිංසා සහ පාලිත බණ්ඩාර යන ක්‍රීඩක ක්‍රීඩිකාවෝ මව්බිම පදක්කම්වලින් සැරසූහ.

අදටත් අපේ රටේ පාලකයෝ ජනතාවගේ බලාපොරොත්තු සුනු විසුණු කරමින් සිටිති. එවැනි මොහොතක ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සහ නෙට්බෝල් කණ්ඩායම ආසියාවේ ශූරයින් බවට පත්වෙමින් ක්‍රීඩාලෝලී හදවත් සිනහවෙන් පුරවාලූහ.

එහෙත් සුපුරුදු ලෙසම ජයග්‍රහණ පසුපසින් බඩගාමින් පෙරහැරේ යන මැති ඇමතිවරු දුටු විට නම් ජනතාව ලෙස අපට ඇති වන්නේ ලැජ්ජාවක් සහ කෝපයක් විනා කිසිසේත්ම ආදර ගෞරවයක් නම් නොවේ. එසේම ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙම ජයග්‍රහණ රැගෙන පැමිණි මාවත කිසිසේත්ම රෝසමල් ඇතිරූ මාවතක්ද නොවුණි. ඒ බව ඔවුන්ගේ මාධ්‍ය සාකච්ඡාවලින් පවා අනාවරණය විය. ඉදින් ක්‍රීඩාවේ හෙට දවස වෙනුවෙන් අපි ඉතා දියුණු වැඩපිළිවෙළක් සහිත පාලනයක් නිර්මාණය කරගත යුතු බව නම් තරයේම විශ්වාස කරමු. නැතහොත් සිදුවන්නේ රටත්, කෙළිමඬලත් එකවර විනාශය කරා යාම බවනම් සහතිකය.



# අනාගත වෙනසක් වෙනුවෙන් වතුකරය සූදානම්!

## තරුණ ලේඛක සදීෂ් සෙල්වරාජ්



**මුලින්ම ඔබ රචනා කළ කෘතියත් එය දිනූ සම්මාන සහ ඇගයීමත් පිළිබඳ යම් අදහසක් පළ කරමු.**

වතුකරයේ ජනතාවගේ ඉතිහාසය සහ දේශපාලනය ආශ්‍රිත ලිපි පෙළක් මාගේ ප්‍රථම කෘතිය වන “ශීත දේශයේ පොරවනයන්” (කුලිරුම් තේසත්තුක් කම්බලිගල්) මඟින් එළිදැක්වූවා. මෙම වසර මුලදී තමිල්නාඩු චෙන්නායි නගරයේ පවත්වන ලද විශාල පොත් ප්‍රදර්ශනයේදී මෙම කෘතිය එළිදක්වනු ලැබුවා.

ලැබුණු සම්මානය පිළිබඳව සඳහන් කරනවා නම් පුදුකෝට්ටෙයි දිස්ත්‍රික් පරිපාලනය සහ තමිල්නාඩු විද්‍යා ව්‍යාපාරය ඒකාබද්ධව සංවිධානය කළ පස්වැනි පුදුකෝට්ටෙයි පොත් උළෙලේදී දේශපාලන, සමාජ, ඉතිහාස, අධ්‍යාපන සහ විද්‍යා අංශයේ විශිෂ්ට කෘතිය සඳහා වූ සම්මානය මේ කෘතියට හිමි වුණා.

**වතු කම්කරුවන් ලෙස ඉන්දියානු දමිළ ජනයා ලංකාවට රැගෙන ඒම ඔබ දකින්නේ කොහොමද?**

මෙරට වැවිලි කර්මාන්තය තුළ සිංහල ජනයා නිරත කරවීම දුෂ්කර බව වටහා ගත් යටත්විජිත පාලකයින් ප්‍රථමයෙන්ම චීනයෙන් කුලීකරුවන් ගෙන ඒමට සැලසුම් කළා. නමුත් ඊට වඩා දකුණු ඉන්දියාවෙන් කම්කරුවන් රැගෙන ඒම පහසු හා ලාභදායී වූ නිසා 1821දී තමිල්නාඩුවේ සිට දමිළ (බහුතරය), තෙළිඟු ජාතිකයින්, මලයාලම් ජාතිකයින් සහ මුස්ලිම්වරුන් රැගෙන ආවා.

ඒ වන විටත් යටත්විජිත පාලකයින්ට එරෙහිව තමිල්නාඩුවේ දිගින් දිගටම සිවිල් යුද්ධ පැවතුණා. යටත්විජිත පාලකයින් විසින් ජලාශ හා කෘෂි බිම් විනාශ කිරීම, ඉඩම් කොල්ලකෑම සහ මෝසම් වැසි නොලැබීම වැනි හේතු නිසා සාගත තත්වයක්ද උද්ගත වී තිබුණා. එසේම අධික ඉඩම් බදු, ජල බදු පැනවීම සහ ඒවා ගෙවීමට අසමත් වූ අවස්ථාවලදී කුරිරු ලෙස දඬුවම් කිරීම හේතුවෙන්ද ජනතාව පීඩාවට පත්ව සිටියා.

අප්‍රිකාවේ මෙන්ම ඉන්දියාව තුළද වහල් වෙළඳාම ආරම්භ කිරීමෙන් අනතුරුව දකුණු ඉන්දියානු ජනතාව කංකානිවරුන්ගේ නායකත්වයෙන් යටත්විජිත වෙත වහලුන් සේ ගෙනයනු ලැබුවා. එලෙස සංක්‍රමණය කරන ලද ජනතාව ලංකාවටද සේන්දු වුණා.

**ලංකාවේ වතුකරය ආශ්‍රිත දෙමළ ජනතාව කියන්නේ ඉතාමත් පීඩාවට පත් වන ජන කොටසක්. ඔවුන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලු මොනවාද?**

වතුකර ජනතාවගේ ප්‍රධානතම ගැටලුව වන්නේ පහත් ආර්ථික මට්ටමයි. මේ ජනතාවගෙන් බහුතරයක් පසුගාමී තත්වයක සිටින බැවින් ඕනෑම ක්ෂේත්‍රයක දියුණුවක් ලබාගැනීම ඔවුනට අභියෝග යක් වී තිබෙනවා. මෙම ජනතාව සතු අපරිමිත ශ්‍රම ශක්තිය විශාල ලෙස සූරාකෑමට බඳුන් වෙනවා. කම්කරුවන්ට ගෙවනු ලබන්නේ ඔවුන්ව දිගින් දිගටම කම්කරුවන් ලෙසම පවත්වා ගැනීමේ අවම වැටුපකුයි. රටේ ආර්ථික තත්වයට සරිලන වැටුප් දිගු කලක් මුළුල්ලේම ලබා දී නැහැ. වැටුප් ප්‍රශ්නය පාලක පන්තියේ දේශපාලනයේ සහ වෘත්තීය සමිතිවල පැවැත්ම ආරක්ෂා කර ගැනීමේ මෙවලමක් ලෙසද පවතිනවා. මාරුවෙන් මාරුවට බලයට පත් වූ ආණ්ඩු, වතු සමාගම්, වතුකරයේ ජනතාව නියෝජනය කරන දේශපාලන පක්ෂ සහ ධනපති වෘත්තීය සමිති මෙකී වංචනික පසුබිම තුළ ඉන්නවා.

එමෙන්ම රජය විසින් විසඳිය යුතු ඉඩම්, සෞඛ්‍ය, අධ්‍යාපන හා ප්‍රවාහන වැනි මූලික ප්‍රශ්නද තවමත් විසඳී නැහැ. එබැවින් වතුකරය අනිකුත් සමාජයන්ට වඩා මුල සිටම රැවටීමට සහ පීඩාවට ලක්වූ සමාජයක් ලෙස පවතිනවා.

**වතු කම්කරුවන් වහල් ශ්‍රමිකයින් ලෙස ගෙන ආ බව ඔබ පවසනවා. අදටත් ඔවුන් ජීවත් වන්නේ වහලුන් ලෙසද, නැතිනම් ඉන් නිදහස්ද?**

වටේටම කටු කම්බි වැට ගසා මුරකරුවන් සහ කංකානිවරුන් විසින් අධීක්ෂණය කළ යටත්විජිත වහල් යුගයෙන් මේ ජනතාව නිදහස ලැබුවත් ඔවුන් තවමත් සම්පූර්ණයෙන්ම එම වහල් ජීවිතයෙන් මිදී නැහැ. සියලුම ජනතාවට මෙයින් විමුක්තිය ලැබිය යුතුව තිබෙනවා.

වතුකරයේ ආරම්භක වකවානුව තුළ බිහි වූ ප්‍රගතිශීලී වාමාංශික දේශපාලනය නිසා එම ජනතාව ත්විවිධ අයිතිවාසිකම් දිනාගත්තා. ඉන් අනතුරුව උපක්‍රමශීලීව කරළියට පැමිණි අවස්ථාවාදී, රැ වට්ටිකාර ප්‍රදේශීය දේශපාලනය විසින් එම ජනතාවගේ අයිතිවාසිකම් සඳහා වූ සටන් පාවා දෙනු ලැබුවා. වතුකරයේ ජනතාව ඉත්තන් ලෙස යොදා ගනිමින් දේශපාලන ලාභ ප්‍රයෝජන ලබා ගන්නේ තොණ්ඩමාන්වරුන්ගේ සහ දිගා පෙරමුණේ දේශපාලන පක්ෂ විසිනුයි.

එමනිසා මේ ජනතාව රවටන දේශපාලනයෙන් සහ ධනපති වෘත්තීය සමිතිවලින් වතු කම්කරුවන් මිදිය යුතුයි. එසේම වතු ජනතාව වතුකරයෙන්ද ඔබ්බට පැමිණ සිතිය යුතුමයි. ඔවුන් කම්කරු පන්ති පදනමින් කම්කරු අරගලවල පෙරමුණ ගත යුතුමයි.

දැනටමත් වතුකර තරුණ ප්‍රජාව අතර එවැනි වෙනසක් නිරීක්ෂණය කළ හැකිව තිබෙනවා. මෑතකදී ආණ්ඩුවට එරෙහිව කොළඹ ප්‍රදේශයේ සිදු වූ විවිධ අරගලවලට කොළඹ නාගරික ප්‍රදේශවල රැකියාවල නිරත වතුකර තරුණ තරුණියන් රැසක් සම්බන්ධ වුණා. එසේම වතුකරයේ සිදු වූ විරෝධතා අරගලවලදීද වතුකරයේ තරුණයින් පෙරමුණ ගත්තා. එබැවින් අනාගත වෙනසක් වෙනුවෙන් වතුකරය සූදානම් බවක් පෙනෙන්නට තිබීම ඉතා යහපත් නිමිත්තක් ලෙසයි දකින්නේ.

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

# යක්කු පඹයෝ කළ බිත්තර ගේම...

රනිල් රාජපක්ෂලාගේ ආණ්ඩුව දිගින් දිගටම ජනතාව පීඩාවට පත් කිරීමට එරෙහිව ජනතාව පාරට බහින්නට පටන් ගෙන තිබේ. ගෝඨාභයට එරෙහිව පාරට බැස්ස මිනිස්සුන්ගේ බලය ගැන පාඩම් උගත් රනිල් රාජපක්ෂලා ජනතාව පාරට බැහීම වැලැක්වීමට විවිධ අණපනත් චක්‍රලේඛන gazette නිකුත් කරමින් ජනතා විරෝධය පාලනය කිරීමට යම් උත්සාහයක් පසුගිය දිනවල ගත්හ. එය යම් දුරකට සාර්ථක විය.

ආර්ථිකය ගොඩ නොනගන රනිල් රාජපක්ෂ ආණ්ඩුව එන්න එන්න ම අසාර්ථක වෙද්දී ඊට එරෙහිව එන ජනතා විරෝධය මර්ධනය කිරීමට විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීම, පාගමන් වලට පහර දීම, සිරගත කිරීම සිදු කරමින් ජනතාව බියට පැත්ත කිරීමට ඔවුන් යත්න දැරීය. එය පරාජය කිරීමට අවශ්‍යව තිබිණි. එයට සංවිධානාත්මක බලයක් අත්‍යාවශ්‍යය. රනිල් රාජපක්ෂලාගේ මර්දනකාරී ආණ්ඩුව පරාජය කිරීමට සංවිධානාත්මක බලය සැප්තැම්බර් 24 වැනිදා සමාජවාදී තරුණ සංගමය රටේ තාරුණ්‍යට නායකත්වය දෙනු ලැබීය. මර්දනකාරී ආන්ඩුවේ බිය ජනතාවගෙන් තුරන් කිරීමට පෙරමුණ ගත්තේය. යන්නට නො දෙනවා යැයි කීය පෙළපාලි ඔවුන් ගියහ. බැටන් පොලුවලින්, කඳුලු ගෑස් වලින්, ජල ප්‍රහාර වලින් සංවිධානාත්මක තරුණ බලය මෙල්ල කිරීමට නොහැකි විය. මර්දනයට උඩගෙඩි දෙන රනිල් රාජපක්ෂලාගෙන් තරු සිහින දකින පොලිස් ලොක්කන්ට ඇසෙන්නට උත්තර දෙන්නට සංවිධානාත්මක බලය සහිත තරුණයෝ සමත් වූහ. ඔවුන් මර්දනයෙන් එළවා දමන්නට නොහැකි විය. අසූ හතරක් අත්අඩංගුවට ගනිද්දී හතක් රෝහල් ගත කරද්දී ධෛර්ය අත්නොහැර සටන් කළහ. නැවත නැවතත් රනිල් රාජපක්ෂලාගේ මර්දන නීතියට එරෙහිව සටන් කළහ. විහාර මහා දේවි එකෙන් නැවත පා ගමන පටන් ගත්ත හ. නිව් ටවුන් හෝල් එකේ රැලියක් ද පැවැත්වීය. පොලිස් ලොක්කන්ට කරකියාගත හැකි කිසිවක් නොවීය. රටේ සංවිධානාත්මක තරුණ බලය මර්දන නීතිය සීමාවන් කීතු කීතු වලට ඉරා දමමින් ජනතාවට සටන් කරන්නට පාරට බහින්නට මග පෑදිය.

අරගලයේ දෙවැනි පියවර සංවිධානාත්මක තරුණ බලය විසින් යලි ඇරඹී ය. සැප්තැම්බර් 24 වෙනිදායින් පසුව ඇරඹී ඇත්තේ අරගලයේ දී පියවරයි. එයට නායකත්වය දිය යුත්තේ සංවිධානාත්මක බලයකිනි. අරමුණු සහගත සංවිධානාත්මක බලයක් මේ දුර්දාන්ත පාලනය පලවාහැරීමට අත්‍යාවශ්‍යය.

අරගලයේ දෙවැනි පියවර අවසන් කළ යුත්තේ අරමුණු සහගත දේශපාලන බලය ලබා ගැනීමෙන් පසුවයි. රට කාබාසිනියා කිරීමට රාජ්‍ය බලය භාවිතා කළ උන්ගෙන් රාජ්‍ය බලය මේ රටේ පීඩිත පන්තිය වෙතට ලබාගත යුතුය. මාරු කළ යුත්තේ ආර්ථිකය නොව දේශපාලන බලයයි. දේශපාලන බලය මාරු කිරීමකින් තොරව ජයග්‍රහණයක් නොමැත. අතරමැදි සමාදානයන් එම ජයග්‍රහණයට අදාල නැත. අරගලයේ දෙවෙනි පියවරට නායකත්වයක් අත්‍යවශ්‍යය සංවිධානාත්මක බලය සහිත නායකත්වයක්, අරමුණු සහගත නායකත්වය, දේශපාලන බලය මාරු කිරීම ඉලක්ක කරගත් නායකත්වයක්, අත්‍යාවශ්‍ය ඒ බව සමාජවාදී තරුණ සංගමය සමාජයට ප්‍රායෝගිකව සැප්තැම්බර් 24 වෙනිදා ඉගැන්වීය ඉන් ඉගෙන ගමු. දේශපාලන බලය මාරු කරමු.

**සැප්තැම්බර් 11**

## ජයග්‍රහණ අහිමි බිමකට සතුට ගෙන ආ දිනය



ශ්‍රී ලංකාවාසීන්ට සතුට ඉහවහ ගිය දවසක් තමයි ඉතින්. මොකද පසුගිය කාලයම ප්‍රශ්නවලින් හෙම්බත් වෙලා මිරිකිලා හිටපු මිනිසුන්ට මේ ලබපු ජයග්‍රහණයත් ඇති සතුටු වෙන්න. එකක් නෙවෙයි දෙකක්ම. ආසියානු නෙට්බෝල් ශූරතාවය හා ආසියානු ක්‍රිකට් ශූරතාවය එකම දවසේ ජයග්‍රහණය කළා. බුකීවාසින්ට ඒ ජයග්‍රහණවල තියෙන අගය නිමක් නෑ කියලා තේරුනේ බුකියේ ගිය පෝස්ට්වලිනුයි. ඉතිං කොහොමහරි කමක් නෑ ජයග්‍රහණ අහිමි අපට ඒකත් ගොඩක් වටිනවා. ඉතිං අපේ කෙල්ලොන්ටයි කොල්ලොන්ටයි සුභ පතමින් ජනයාට කියන්න තියෙන්නේ තවත් කුසලානයක් දිනන්න තියනවා කියලයි. ඒ තමයි මේ මජර දේශපාලකයින්ව අතුගාලා දාලා අපේ රටට අලුත් පාලනයක් පත්කර ගැනීම. අන්න එදාට තමයි අපේ රටේ හැම මිනිහෙක්ටම ජය පැන් බොන්න පුළුවන් වෙන්නේ.

**සැප්තැම්බර් 14**

## පාසැල් ළමුන්ට කලන්තෙ දාන්නම දෙයි



වේදනාබර පෝස්ට්ටුවක් බුකියේ ෂෙයාර් වෙමින් තිබුණා. පාසැල්වල උදෑසන රැස්වීම්වල ක්ලාන්ත වී ඇද වැටෙන ශිෂ්‍යයින් ගණන වැඩි වෙලා. එයට හේතු වී ඇත්තේ උදෑසන ආහාර නොමැතිව පාසල් එන ළමුන් ගණන වැඩි වීමයි. වසර 74ක් අපේ රට පාලනය කළ ආණ්ඩු මේකට වගකියන්න ඕනා. මාරුවෙන් මාරුවට ආණ්ඩු කළ පාලකයන්ගේ ප්‍රතිපත්ති වුනේ උන්ගේ මඩිය තද කරගැනීමයි. වංචාව, දූෂණය හා කොමිස් ගැහිලි විතරයි. ඒ නිසා අපේ රටේ ජනතාව ලෝකයට ණයකාරයෝ වෙලා. ආදායම් හීන වෙලා. වියදම් දෙගුණ තෙගුණ වෙලා. එහි ප්‍රතිඵලය තමයි තුන් වේලක් කාපු මිනිස්සු දෙවේලකටත්, දෙවේලක් කාපු මිනිස්සු වේලකටත් සීමා වීම. අන්තිමේදි නිරාහාරව පාසල් යන සිසුන් ප්‍රමාණය වැඩිවෙලා. ඒ විතරක් නෙවෙයි පාසල් උපකරණවල මිල 200% කින් ඉහළ ගිහිල්ලා. අපේ රටේ පාසල් යන ළමුන් ප්‍රමාණයද අඩුවී තිබෙන බවයි කියන්නේ. මේ විනාශ කරලා තියෙන්නේ අපේ රටේ අනාගතයයි. ඒ නිසා මේ දූෂිත පාලක පන්තිය වෙනුවට අලුත් බලවේගයකට අපේ රටේ පාලන බලය ලබා නොදුනහොත් අපි ඉතිහාසයේ අත්නොවින්ද තරමේ ඛේදවාචකයකට පත්වෙන එක් වැළැක්විය නොහැකියි.

**සැප්තැම්බර් 14**

## ඖෂධ හිඟය දරුණු වෙයි



රටේ හැමතැනම කතාබහට ලක්වෙලා. මහරගම අපේක්ෂා රෝහලේ පිළිකා රෝගීන්ට දෙන ඖෂධ හැටක් පමණ හිඟ යිලු. ගාල්ල කරාපිටිය රෝහලේ වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් මාසයක විතර ඉඳන් නතර වෙලා. සැත්කම්වලට දින දුන්නත් රෝගීන්ව ආපසු හරවා යවන්න සිදුවෙලා කියලා වෛද්‍යවරු පවසනවා. ජලභීතිකා රෝග යට, සර්පයින් දෂ්ට කළ විට ලබාදෙන බෙහෙත් ඇතුළු විශාල බෙහෙත් වර්ග ප්‍රමාණයක් දැන් රට තුළ නැති බව ප්‍රකාශ වෙනවා. ඒ කියන්නේ රෝගීන්ගේ ජීවිත අහිමි වීමට පවා පුළුවන්. බෙහෙත් ටික නැතිව මිනිස්සු මැරෙනවා කියන්නේ මොන අපරාධයක්ද? හරියට මිනී මැරුමක් වගේ. ආණ්ඩුව මේකට වගකියන්න ඕනා. අදාළ බලධාරීන්ගෙන් මාධ්‍යවේදීන් ප්‍රශ්න අහනකොට “මම ඒ ගැන දන්නේ නැහැ” කියන තැනට බලධාරීන් පත්වෙලා. අමාත්‍යවරයා ඇතුළු මේ බලධාරීන් වැල්බයිලා කියවනකොට සැත්කමක්වත් කරගන්න බැරිව තම ජීවිතවලින් වන්දි ගෙවන්න සිදුවෙලා තියෙන්නේ අපේ රටේ අහිංසක ජනතාවටයි. ලෙඩ සුවපත් කරන්න බෙහෙත් ටිකවත් දී ගන්න බැරි නම් ඒ බංකොලොත් ආණ්ඩු මොකටද?

**සැප්තැම්බර් 14**

## විකුණන කතාවේ සඟවන ඇත්ත

ජාතික ජනබලවේගය විසින් සංවිධානය කළ ‘විකුණන කතාවේ සඟවන ඇත්ත’ සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පැවැත්වූයේ අනුර දිසානායක සහෝදරයායි.



“ජනතාව අතර දැන් කතාවක් ගොඩනගමින් යනවා රාජ්‍ය ආයතන විකුණලා හරි මේක ගොඩදාන්න ඕනා කියලා. මේ ආණ්ඩුවේ ජනවරම ඒක නෙවෙයි. විකුණපුවත් නැවත පවරාග න්නවා කියන ජනවරම, ඒ කියන්නෙ රාජ්‍ය දේපළ ආරක්ෂා කරනවා කියන එකයි. හැබැයි රනිල්ට තියෙන ජනවරම ඊට ප්‍රතිවිරුද්ධ එකක්. දැන් වතු ටික විකිණුවා. හැබැයි වත්තේ වැඩකරන සේවකයෙකුට රුපියල් 1000ක් දෙන්න බෑ කියනවා. ඉතිං ඒ පෞද්ගලීකරණය කිරීමෙන් අත්වෙලා තියෙන සේවය මොකක්ද? කඩදාසි කම්මල වික්කා. කෝ අද දියුණු වෙලාද? අද පත්තරයක් ගහන්න කොළයක් නැතිවෙලා. හැබැයි අපට චිත්‍රයක් හදනවා, පෞද්ගලීකරණය තමයි ආර්ථික සංවර්ධන මාවතේ ඉතාමත් දීප්තිමත්ම මාවත කියලා. ඒක බොරුවක්.” යනුවෙන් අනුර සහෝදරයා එහිදී අදහස් දක්වමින් පැවසීය.




# ඔවුහු පෙරළති පොත්

උදාවී ඇත්තේ සාහිත්‍ය මාසය වුවද අද පොතක්පතක් ගැනීම හෝ සාහිත්‍ය කෘතියක්, කවියක්, ගීතයක් රසවිඳීම තබා, වේලක් දෙවේලක් සපුරමින් අවම ජීවන පහසුකම්වත් සපුරාගැනීමට නොහැකිව ශ්‍රී ලාංකික අපි අතිශය දුෂ්කර ජීවන අරගලයක නියැලී සිටින්නෙමු.

එහෙත් පසුගිය කාලය තුළ පළ වූ මාධ්‍ය වාර්තාවලට අනුව ශ්‍රී ලංකා පොලිසිය මගින් අරගලකරුවන් යැයි හඳුන්වන ලද පිරිසක් විසින්, 2022 ජූලි 09 වන දින ගිනි තබන ලදැයි කියන, වටිනා පොත් විශාල ප්‍රමාණයක් තිබුණා යැයි කියන, පුස්තකාලයේ අයිතිකරු, මහා මොළකරු, මහා සාහිත්‍යධර යැයි කියන රනිල් වික්‍රමසිංහ, ශ්‍රී ලංකාවේ ඉහළම තනතුර වන විධායක ජනාධිපති පුටුවේ අසුන් ගෙන සිටිනා මොහොතක සාහිත්‍යය ගැන කතා නොකිරීම මදිකමකි.

ලෝකප්‍රකට සෝවියට් රුසියානු ලේඛක මැක්සිම් ගෝර්කිට අනුව "සාහිත්‍යකරුවා සිය පන්තියේ ඇස්, කන් හා කටහඬ විය යුතුය... ඔහු අනිවාර්යයෙන්ම සිය පන්තියේ ප්‍රකාශනයක් බඳු විය යුතුය."

කෙතරම් පොතපත ඇසුරු කළද, කවි හෝ පොත් ලියුවද එදා මිනිසුන් සියදහස් ගණනක් පණපිටින් විස වායු කුටිවල සිරකර මරා දැමූ හිට්ලර් මෙන්ම අද පුස්තකාලයක තරම් පොත්පත් ඇසුරු කළා යැයි කියන රනිල් වික්‍රමසිංහ පවා නියෝජනය කරන්නේ ඔවුන් අයත් පන්තියම විනා අන්‍යමක් නොවේ. ඔවුන් විසින් පෙරළනු ලැබූ සාහිත කෘතීන් දෙස මෙන්ම දේශපාලන පොත් දෙසද විමසිල්ලෙන් බැලූයේ නම් එහි ඇති අරුමයක් නොමැති බව ඔබට වැටහෙනු ඇති.

සැබැවින්ම අද රනිල් වික්‍රමසිංහ විසින් ජනතාවට කොළේ වසා ඔහුටම අනන්‍ය වූ ඔහුගෙ "ම දේශපාලන සාහිත්‍යයක පිටු පෙරළමින් සිටී. එබැවින්ම අන් කවරදාකටත් වඩා අපි සාහිත්‍යයේ දේශපාලනයද, දේශපාලනයේ සාහිත්‍යයද කියවාගත යුතුව ඇත්තෙමු...

උපනුපන් පරපුරක අනාගතය වෙනුවෙන් සටන් කළ, සටන් කරන අරගලකරුවන්ට විවිධ චෝදනා නගමින් රනිල්ගේ මර්දනයේ හස්තයට ගොදුරු කරගනිමින්ද පුරවැසියන් සතු භාෂණයේ නිදහස, මානව හිමිකම් පවා කිසිඳු හිරිකිතයකින් තොරව අමු අමුවේ උල්ලංඝනය කරමින්ද සිටින මොහොතක රනිල්ට අමතක වූ යමක් මතක් කර දීමටද කැමැත්තෙමු.

"අපේ කාලෙදි යාපනය පුස්තකාලය ගිනි තිබ්බා. අපි ඒ ගැන කණගාටු වෙනවා, සමාව ඉල්ලා සිටිනවා." ඒ රනිල් වික්‍රමසිංහ අගමැතිව සිටින කල්හි 2018 දෙසැම්බර් 09 වෙනිදා පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශයකි. එසේම යුද සමයෙහිදී පල්ලි සහ කෝවිල් පවා විනාශ කර ඇති බවත්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂටද හැකිනම් ඒ සම්බන්ධයෙන් සමාව ගැනීමට තමන් අභියෝග කරන බවත් එහිදී රනිල් වික්‍රමසිංහ පවසා සිටියේය.

වසර 41කට පෙර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පමණක් නොව සංස්කෘත, ලන්දේසි, ප්‍රංශ හා ලතින් ආදී භාෂාවන්ගෙන් පවා ලියවුණු පොතපත සහ ඓතිහාසික ලියවිලි ඇතුළු 95000කට අධික ග්‍රන්ථ සම්භාරයකට නිවහන වූයේ එවකට දකුණු ආසියාවේ විශාලතම පුස්තකාලය වූ යාපනය පුස්තකාලයයි. එදා එය ගිනිතබා විනාශ කිරීම සම්බන්ධයෙන් එවක පැවති එක්සත් ජාතික පක්ෂ රජයේ ප්‍රධාන වගකිවයුත්තෙක් වන එහි තරුණ කටයුතු භාර අමාත්‍යවරයා වූ වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහම, අද යුද්ධයේදී සිදු වූ දේපළ හානි සම්බන්ධයෙන් වගකිවයුත්තෙකු බවට ඔහුම චෝදනා නගන ලද මහින්ද රාජපක්ෂගේම පවුලේ ආරක්ෂකයා ලෙස රාජපක්ෂවරුන්ගේම උර මතින් ජනපති පුටුවේ සැප විඳීමේ සාහිත්‍යය නම් ඇත්තටම ඇත්තේ වෙනමම තලයකය.

එවන් පැටිකිරියක් සහිත රනිල් වික්‍රමසිංහ කියවූ පොත් පිළිබඳව අපට නම් ඇත්තේ කුකුසකි. ගෙදර පොත් ගැන කියා ශෝක වීමටත්, දහසක් දෙනා පරිහරණය කළ යාපනය පුස්තකාලය විනාශ කරදැමීමේ පුරෝගාමියෙකු වීමටත් මෙන්ම වධකාගාර පවත්වාගෙන යමින් තරුණයින් මර්දනය කිරීමටත්, මැර බලය යොදාගෙන ගෝඨාගෝගම පුස්තකාලය සුනුවිසුණු කරදැමීමටත් තරම් ඔහුගේ පොත් පිළිබඳ ඇල්ම සහ හදවතේ සංවේදී බව ඇත්තේ අහස පොළව තරම් විශාල දුරකින් විය යුතුය.

ඒ නිසා පොත් ගොඩගසා තිබූ පමණින් හෝ පොතපත ඇසුරු කළ පමණින් හෝ ගුණවතුන් බිහිවන්නේ නැති බවත්, මිනිහෙක් තවත් මිනිහෙක් වෙනුවෙන් සංවේදී වන්නේ නැති බවත් බලයෙන් හිරිවැටුණු මේ මිනිසා අපට පසක් කර හමාරය.

කවදත් මෙවන් පාලකයින්ගේ පෞද්ගලික පරිහරණය වෙනුවෙන් පුස්තකාල පිටින් තිබුණද අදටත් ලාංකික දරුවන්ගේ පාසල්වල පුස්තකාල හිස්ය. ඔන්ලයින් තාක්ෂණය ගමට තවමත් හරි දුරය. දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ට පවා පොතක්පතක්, සිනමා කෘතියක් රසවිඳීම තව බොහෝ ඈතය. නමුත් සෑම මැතිවරණයකදීම ඔවුන් ජනතාවට පොරොන්දු වූයේ ටැබ්ය, ලැප්ටොප්ය, ෆ්‍රී වයිෆයිය, පාසලට පුස්තකාලය.

ඉඳින් මැතිවරණවලදී පමණක් නොව රනිල් වික්‍රමසිංහ, රාජපක්ෂ නඩය ඇතුළු වසර 74ක් පුරා මෙරට පාලනය කළ පාලකයින් විසින් අපට, අපේ ජීවිතවලට පෙරළා ඇත්තේ පොත් නොවේ, පුස්තකාල පිටින්ය. ඔවුන් අපගේ පණ අදින ජීවිතවලට සුවපත් වීම වෙනුවට බලකර සිටින්නේ මත්වීමටය. "ජීවිතය" අමතක කර සොයාගන්නා දෙයක් කා " කරුමයක්" ගෙවීමටය. ඔවුන්ගේ පොත් එසේය... ඔවුන්ගේ සාහිත්‍යය එසේය... ධනපති පාලකයින් විසින් ආගම් හා සියලු සාහිත්‍යයන් හැකි සියලු ආකාරයෙන්ම යොදාගනුයේ ඔවුන්ගේම පංතියේ ආරක්ෂාවට විනා සුවපත් සමාජයක් බිහිකිරීම වෙනුවෙන් නොවේය...

එනිසා පොතපත ඇතුළු සාහිත්‍යය ඇසුරු කිරීමේ අවසන් පරමාර්ථය අතිශය වැදගත්ය... මෙතෙක් මෙරට පාලනය කළ ධනපති පාලකයින් විසින් තම බලය තරකරගැනීම වෙනුවෙන් පොත්පත් හි ඇති ලෝකයක් ගැන හීන පෙන්වා මැතිවරණවලදී ජනතාවට මත්පැන්, මුදල් හා සිහින පමණක් බෙදද්දී, මිනිස්සුන්ගේ චින්තනය දියුණු කිරීම වෙනුවෙන්, සමාජය තවත් පියවරක් හෝ ඉදිරියට රැගෙන යාම වෙනුවෙන් තම සෑම හමුවකදීම, දේශපාලන රැළියකදීම පොත්, පත්තර, දැනුම හා රසවින්දනය බෙදන, උදාර පරමාර්ථයෙන් යුතු දේශපාලන පක්ෂද තිබෙන බව පසක් කළ යුතුමය...



# පොලිසියත් හොරකමේ යවන ආර්ථිකයක්!

මංකොල්ලකෑමක් සම්බන්ධයෙන් පසුගියදා මාලබේ පොලිසියේ නිලධාරීන් සිව් දෙනෙකුගේ වැඩ තහනම් කළේය. මාතර දුම්රිය ස්ථානයේ දුම්රිය ප්‍රවේශපත් නිකුත් කිරීම නවතා දැමුවේ ප්‍රවේශපත් මුද්‍රණය සඳහා ගන්නා මුද්‍රණ කඩදාසි නොමැති හෙයිනි. එසේම අපේ රට ලෝකයේ වැඩිම ආහාර උද්ධමනයක් සහිත රටවල් අතරින් සිව්වෙනි ස්ථානය බව ලෝක බැංකු වාර්තා මගින් හෙළි විය. ජාත්‍යන්තර සංවිධාන අපේ රටට ආධාර කරන ලෙස ලෝක ප්‍රජාවගෙන් විවෘත ඉල්ලීමක්ද කළේය.

අපේ රට හා ආර්ථිකය ලෝකය ඉදිරියේ පත්ව ඇති තත්වය එයයි. මහ බැංකු අධිපතිවරයාට අනුව අපේ රටේ විදෙස් වත්කම්වල වටිනාකම බිංදුවකි. සැලසුමකින් තොරව, තිබූ විදෙස් වත්කම් ප්‍රමාණයද අවසන් කරදැමීම හා අධික ලෙස මුදල් මුද්‍රණය කිරීම මෙම අර්බුදය වේගවත් වීමට බලපෑ බව මහ බැංකු අධිපතිවරයාම පවසයි. රටට විදෙස් වත්කම් ගලාගෙන ආ මාර්ග සියල්ල අකර්මණ්‍ය වී ගොසිනි. විදෙස් ප්‍රේෂණ විශාල ලෙස අඩුවීම, සංචාරක කර්මාන්තය කඩා වැටීම, ඇඟලුම් නිෂ්පාදන පහළයාම මෙම අර්බුදය ඉහළයාමට විශාල ලෙස බලපා ඇත.

මෙම අර්බුදයෙන් ගොඩ ඒමට වත්මන් රනිල් රාජපක්ෂ ආණ්ඩුව කිසිම සාධනීය පියවරක් ගෙන නොමැත. මොවුන් අර්බුදයට විසඳුම් ලෙස ගෙන ඇත්තේ අර්බුදය තවත් තීව්‍ර කරන පන්නයේ සුපුරුදු ක්‍රියාමාර්ගයන්මය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මත විශ්වාසය තබමින් හා යටත් වෙමින් ආර්ථික තීරණ ගැනීම මෙහි ප්‍රධානතම අර්බුදයයි. ඩොලර් බිලියන 2.9ක ස්ථායීකරණ මගින් රට පත්ව ඇති අර්බුදයට කිසිඳු ලෙසකින් කෙටිකාලීන සහනයක් හෝ නොලැබේ. මන්ද 90%ක් දක්වා වර්ධනය වී ඇති ආහාර උද්ධමනය පාලනය කිරීමට මෙම මුදල් භාවිතා කළ නොහැක, 66%ක් දක්වා වර්ධනය වී ඇති භාණ්ඩ උද්ධමනය පාලනය කිරීමට තෙල් අර්බුදය පියමන් කිරීමට මෙන්ම පොහොර ගෙන්වීම වෙනුවෙන් හෝ මෙම මුදල් භාවිතා කළ නොහැක. මෙම මුදල් ලැබෙන්නේ ආර්ථික ස්ථායීකරණය සඳහා පමණි(විදෙස් වත්කම් වැඩිකර පෙන්වීම සඳහා පමණි). මෙම මුදල මාස 48කින්, කොටස් ලෙස ලැබෙන නිසා එකවර ආර්ථිකයට යෙදවිය ද නොහැක. 16 වතාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යන අධිරාජ්‍යවාදී උගුල මතම විස්වාසය තැබූ අපේ රටේ පාලකයින්, 17 වන වතාවටත් එයම ක්‍රියාත්මක කරමින් සිටියි.

මෙම IMF ණය ලබාගන්නේ ඔවුන්ගේ කොන්දේසිවලට සුපුරුදු පරිදිම යටත් වෙමිනි. මෙම මුදල් ලබාගැනීම වෙනුවෙන් නැවත වතාවක් රටත්, ජනතාවත් බිල්ලට තබා ඇත. අතුරු අය-වැය ගෙන එන්නේ ඒ අනුවය. එයින් ආණ්ඩුව උත්සහ කර ඇත්තේ බදු ආදායම් වැඩි කරගැනීමට තම ආණ්ඩුව මැදිහත් වන බව පෙන්වීමටය. ඒ අනුව 12% තිබූ වැට් බද්ද 15%ක් දක්වා ඉහළ දැමීය. එය ආර්ථික පීඩාව දරාගත නොහැකිව සිටින ජනතාව නැවත වරක් උස්සා පොළොවේ ගැසීමකි. සියලු භාණ්ඩවල මිල මේ අනුව ඉහළ ගොස් ඇත. සියලුම ජංගම, ස්ථාවර දුරකථන හා බ්‍රෝඩ්බෑන්ඩ් ගාස්තු සහ සෙසු පෙරගෙවුම් හා පසුගෙවුම් ගාස්තු 20%කින් ඉහළ දැමීය. මුදල් ගෙවා නරඹන රූපවාහිනී සේවා ගාස්තු 25%කින් ඉහළ දැමෙන බවටද දුරකථන සමාගම් දැනුම් දී තිබේ.

අවුරුදු 18ට වැඩි සියලු දෙනාට බදු ගොනුවක් ආරම්භ කිරීමට යෝජනා කිරීම, රටේ සියලු දෙනා බද්දකට යටත් කිරීමට සූදානම් වීමකි. හරිහමන් රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් නොමැති අපේ රටේ සාතිශය බහුතරයක් ජනතාවට මෙය කෙසේවත් දරාගත නොහැක. මන්ද අපේ රටේ වයස 24-35 අතර තරුණ වයසේ විරැකියාව පමණක් 28%කි. මොවුන් බදු දැලකට යටත් කිරීම කෙතරම් යුක්ති සහගතද?.

විදුලි බිල් ඉහළ දැමීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පැසසුමට ලක්විය. නමුත් ජනතාව එයින් බැටකමින් ඇත. සමස්ත වැඩිවීම 75%ක් ලෙස හුවා දැක්වුවද ඒකක 30ට අඩුවෙන් පාවිච්චි කරන අයට 264%කින් විදුලි බිල වැඩි කිරීම කිසිසේත්ම දරාගත නොහැක.

මෙලෙස IMF පදයට ජනතාව මතම බදු බර පටවන වත්මන් රනිල් රාජපක්ෂ ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව මීළඟට ක්‍රියාත්මක කිරීමට සැරසෙන්නේ, ප්‍රතිව්‍යුහගතකරණය මුවාවෙන් රාජ්‍ය දේපළ පුද්ගලීකරණය කිරීමට හා විකුණා දැමීමටය. ඒ අනුව පාඩු ලබන ආයතන ලෙස නම් කර දැනටත් ලාභ ලබන ආයතන විකුණා දැමීමට සැරසේ. ඛනිජ තෙල් සංස්ථාව, විදුලිබල මණ්ඩලය, ටෙලිකොම්, රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකන් ගුවන් සේවාව මේ අතරින් ප්‍රධාන වේ. මේවා පාඩු ලබන ආයතන ලෙස හුවා දැක්වීමට උත්සාහ දැරූවද පසුගිය කාලය තුල පාඩු ලබා නොමැත. උදාහරණයක් ලෙස රක්ෂණ සංස්ථාව ගතහොත් 2021 වසරේ බදු ලෙස ආණ්ඩුවට රු. මිලියන 1700ක්ද, ලාභාංශ ලෙස රු. මිලියන 1500ක්, කොටස්කරුවන් අතරේද බෙදා ඇත. පාඩු ලබන්නේ නම් මෙලෙස බදු ගෙවන්නේ, ලාභාංශ බෙදා දෙන්නේ කෙසේද? ශ්‍රී ලංකන් ගුවන් සේවාවේද කේටරින් සේවයේ 2021 වර්ෂයේ ලාභය රු. මිලියන 2786කි. ග්‍රවුන්ඩ් හැඬලින් සේවාවෙන් 2021-2022 වසරවල රු. මිලියන 5009ක ලාභයක් උපයා ඇත. මෙලෙස ලාභ උපයන රාජ්‍ය ආයතන විකුණා දැමීම නිසැකවම IMF උගුලට යටත් වීමකි.

රටත්, ජනතාවත් IMF උගුලේ සිරකිරීමට නීති සකසන රනිල් රාජපක්ෂලා ඔවුන්ගේ වියදම් වැඩි කරගැනීමටත්, ආර්ථික අර්බුදය මගින් අහිමි වන දීමනා හා වරප්‍රසාද රැකගැනීම වෙනුවෙනුත් සුපුරුදු පරිදි නීති සකසමින් ඇත. ඉන්ධන දීමනා සංශෝධනය කරගැනීම මීට කදිම නිදසුනයි. කලින් මැති ඇමතිවරුන්ගේ ඉන්ධන වියදම් සඳහා ඉන්ධන කෝටාවක් වෙන් වුවද වර්තමානයේදී එය ඉන්ධන කෝටාවේ වටිනාකමට අනුව මුදල් වෙන්කරන ලෙස යාවත්කාලීන කරගැනීමට ඉක්මන් විය. තම බල දේශපාලන වුවමනාවන් පවත්වාගෙන යාම වෙනුවෙන් නව රාජ්‍ය ඇමතිවරු 29 දෙනෙක් පත් කළේය. මෙම රාජ්‍ය ඇමතිවරයෙක්ගේ ඉන්ධන හා දුරකථන ගාස්තුව පමණක් මසකට රුපියල් 152,500කි. මෙලෙස නිකරුණේ පත්කරන ලද රාජ්‍ය ඇමතිවරුන්ගේ ඉන්ධන හා දුරකථන වියදම් වෙනුවෙන් මාසිකව රුපියල් 4 422 500ක් දැරීමට ජනතාවට සිදුවේ.

ජනතාවට ආහාර වේලක් නොමැතිව කුසගින්නේ සිටීමට සිදු වූ රටක, ජීවත්වීමට සිය වැටුප පමණක් ප්‍රමාණවත් නොමැති නිසා පොලිස් නිලධාරීන්ටත් මංකොල්ලකෑමට සිදු වී ඇත. රටේ විදෙස් සංචිත බිංදුවට බැස ලෝකයක් ඉදිරියේ බාල්දු වෙමින් ඇති මොහොතක, රටේ පාලකයින් සුපුරුදු පාරේ යමින්, රටත්, සමාජයත්, රටේ ආර්ථිකයත් විනාශ කරමින් සිටින්නේ තම බල දේශපාලන උවමනාවන් වෙනුවෙන්ම පමණි. ඒ බව අදත්, 74 වසරක අතීතයක් පුරාවටත් ඔප්පු කරමින් ඇත.

# කාශ්‍යප විසින් ධාතුසේන රජු වැව්බැම්මේ පස් ගසා මරාදැමුවාද? ඉතිහාසය විචාරාත්මක ඇසින්...




ඉතිහාසය පරිකල්පනයකි. එය කතුවරයාගේ දෘෂ්ටියත්, සමාජ අවශ්‍යතාවත් අනුව විවිධ වෙනස්කම්වලට ලක්වේ. ශ්‍රී ලංකාවේ ඓතිහාසික ලේඛන අතර ප්‍රමුඛත්වයක් මහානාම හිමිගේ මහාවංශයට හිමිවේ. ක්‍රි.ව. 477 දී රාජ්‍යත්වයට පත් කාශ්‍යප පිළිබඳ මහාවංශයේ අර්ථකථනයට ප්‍රතිපක්ෂ අර්ථකථනයක් ලබාදීම මොහාන් රාජ් මඩවලගේ නිල්කට්රොල් කෘතියේදී සිදුවේ. කෘතියේ ආකෘතියට අනුව කථා පුවත අනාගතයෙන් ආරම්භ වී අතීතයට දිවයයි.

නිල්කට්රොල්හි හමුවන අමේෂ් දේවසුරේන්ද්‍ර සීගිරි චිත්‍ර ශිල්පියා සොයා දේවදත්ත සහ දේවමිත්ත යන නම්වලින් පෙනී සිටිමින් කාලතරණය කර කාශ්‍යපගේ කාලයට ගමන් කළේය. කාශ්‍යපගේ මව කම්මල්කරුවෙකුගේ දියණියක වූ උපුලීය. ඇය කාලවර්ණ, කුලහීන තැනැත්තියක් බැවින් කාශ්‍යපද කුලහීනය. මෙම ගැටලුව රාජ්‍යත්වය ලබාගැනීමේදී කාශ්‍යපට පැවති ප්‍රබලම අභියෝගය විය.

න්‍යායිකව ද රාජ්‍යයකට ආගමක් තිබිය නොහැකිමුත් අතීතයේ පටන් මෙරට පාලකයා රාජ්‍ය ආගම බෞද්ධාගම කරගනිමින් තම පාලනය සිදුකළේය. ධාතුසේනටද සිය බලය තහවුරු කරගැනීම සඳහා උපක්‍රමශීලීව ආගම යොදාගැනීමට සිදුවිය. සත්‍ය වශයෙන්ම මෙහිදී සිදුව ඇත්තේ පාලකයා ආගම සිය අවශ්‍යතාව අනුව යොදාගැනීමත්, භික්ෂූහු සුඛ විහරණය වෙනුවෙන් රාජ්‍ය කටයුතුවලට නිරන්තරයෙන් සම්බන්ධවීමත් යන දෙයාකාරයමය. කේතකී බිසවද මුගලන් රජකිරීම වෙනුවෙන් නිරන්තරයෙන් මහාවිහාරීය භික්ෂූණ්ට නොයෙක් පුද පූජා සිදු කළ බැවින් ඇගේ අනුග්‍රහය ලද මහාවිහාරීය භික්ෂූණ් නිරන්තරයෙන් රාජ්‍ය පාලනයට බලපෑම් කළහ.

"ඔබතුමාගෙන් පස්සෙ මේ රටේ රජ වෙන්නෙ රාජ්‍යත්වයට උරුමය තියෙන වංශවත් කුමාරයෙක්ද නැද්ද කියලා මහා විහාරයේ අපි බලාගෙන ඉන්නවා." යන පාඨයට අනුව එකල රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් භික්ෂුවගේ මැදිහත්වීම කෙතරම් ප්‍රබල වූයේද යන්න සපථ කරයි. නිරන්තරයෙන් භික්ෂූහු දේශපාලනයට අතපෙවීම "ඇයි උන්නාන්සේලාට බැරි, රටේ දේශපාලනයට ඇඟිලි නොගහ ඉන්ඩ. ඇයි උන්නාන්සේලාට බැරි, මිනිස්සුන්ගෙ ආධ්‍යාත්මික සුඛසිද්ධිය ගැන විතරක් කටයුතු කරගෙන ඉන්ඩ..." යනාදී වශයෙන් කතුවරයා ධාතුසේනගෙන් ප්‍රශ්න කරයි.

ධාතුසේනගෙන් පසු රාජ්‍යත්වය මුගලන්ට හිමිවීම මහාවිහාරීය භික්ෂූණ්ගේත් මාලිගාවේ බහුතරයේත් අපේක්ෂාව බැවින් සිය ආරක්ෂාව පතා උපුලීත්, කාශ්‍යපත් මාලිගය අතහැර ගොස්, කුලහීන මිනිසුන් දහස් ගණනකගේ සහයෝගය සහිතව සීගිරි උද්‍යානය නිර්මාණය කළහ. එයින් විස්මයට පත් ධාතුසේන, කාශ්‍යපගේ දක්ෂතාවයත්, නිර්මාණශීලී චින්තනයත් අගය කරමින් රාජ්‍යත්වය ප්‍රදානය කළේය. සීගිරිය රාජධානිය කරගත් කාශ්‍යප ස්ත්‍රියගේ සුන්දරත්වය සීගිරියේ සිත්තම් කරවූ අතර ඒවා ආගමික සංකල්පයෙන් තොරවූ නිවහල් සිතුවම් විය. එනම්, ඉතිහාසයේ ආගමික සම්ප්‍රදායට යටත් නොවී ස්වාධීනව සිය අයිතිවාසිකම් වෙනුවෙන් මැදිහත්වූ කුලහීන පිරිසක් එකල බිහිවූ බවය.

"...මගේ බිසවු සිව්දෙනාගේ සිට හැම ලලනාවකගේම සිතුවම් එතන තියෙන්ඩ ඕන... නාටිකාංගනාවන්, සේවිකාවන්, දාසියන් මේ හැම කෙනෙක්ම...!" යන ප්‍රකාශයට අනුව කාශ්‍යප කුලභේදය ප්‍රතික්ෂේප කළ රජෙක් ලෙසත්, දියුණු චින්තනයක් සහිත රජෙක් ලෙසත් හඳුනාගත හැකිය.

කාශ්‍යපගේ වර්ධනය නොඉවසූ මහාවිහාරීය භික්ෂූණ් සීගිරි බිහිදොරට වැඩම කොට රාජ්‍ය පාලකයෙකුට එරෙහිව තමන්ට කළහැකි දරුණුතම සංකේතාත්මක විරෝධය පෑහ. අනතුරුව කාශ්‍යපගේ ශක්තිය ඔහු වටා ඇති ජන පවුරත්, මිගාර සෙන්පති කේන්ද්‍රකොට ගත් යුධ ශක්තියත් බව අවබෝධ කරගන්නා මහානාම හිමි ඔහු දුර්වල කිරීමට සැලසුම් කළහ.

"මට තේරුම් ගන්ඩම බැරි දේ තමයි, කාශ්‍යප වගේ රජ කෙනෙක් තමන්ගෙ පිය රජ්ජුරුවො ඒ තරම් අමානුෂික විදිහට ඝාතනය කළේ කොහොමද කියන එක..... ඒක නිකම්ම නිකම් ඝාතනයකුත් නෙමෙයි. මහා අමානුෂික ඝාතනයක්.. මොන දරුවෙකුටද පුළුවන් එයා ජාතක කළ පියාණන් බැම්මකට තද කරලා... පස් ගහලා... පණ පිටින් මරන්ඩ...?"

මහානාම හිමි මුගලන්ගේ පාර්ශවය ගනිමින් කාශ්‍යප අමානුෂික පීතෘ ඝාතකයෙකු කොට මහාවංශය රචනා කළහ. මෙම මතවාදය කාශ්‍යප වටා පැවති ජන පවුර දෙදරා යාමටත්, ලේඛනගත ඉතිහාසයේ අඳුරු සලකුණක් ලෙස කාශ්‍යප නාමය සනිටුහන් වීමටත් හේතුවිණි.

"...තම දියණියට පහර දුන්නා යැයි කියා ධාතුසේන රජ්ජුරුවො තම සොහොයුරිය නැත්නම් සෙන්පති මිගාරගේ මව අමානුෂික ලෙස නිරුවත් කොට පුළුස්සා මරා දමනවා..."

කාශ්‍යපට පක්ෂපාත, මිගාර සෙන්පති වටා යුධ ශක්තිය කේන්ද්‍රගතව පැවතුණි. ශක්තිමත් දේශීය හමුදාවක් මුගලන් වෙනුවෙන් ගොඩනැගීමටත්, කාශ්‍යපගේ දක්ෂතාත් දුබලතාත් මැනවින් හඳුනා ගැනීමටත් මිගාර නැවත මුගලන්ගේ පාර්ශවයට සම්බන්ධ කරගැනීමට මහානාම හිමිට අවශ්‍ය විය. එහෙයින් මිගාරගේ මව අමානුෂික ලෙස ධාතුසේන විසින් මරා දැමූ බවට මතවාදයක් ගොඩනැගුවේය. එහි ප්‍රතිඵලයක් ලෙස ධාතුසේන සමඟ උරණ වන මිගාර කාශ්‍යපට විරුද්ධ වේ. නමුත් කාශ්‍යප සහ මුගලන් යන දෙදෙනාම ධාතුසේනගේ පුත්‍රයන් වන බැවින් සත්‍ය වශයෙන්ම සිදුවන්නේ මහානාම හිමි ප්‍රමුඛ මහාවිහාරීය භික්ෂූණ්ගේත්, කේතකී බිසවගේත් අවශ්‍යතාව මත මිගාර සෙන්පති උපායශීලීව යොදාගැනීමකි. එහිදී කුලහීනයාගේ බලය බිඳ කුලවතා වෙත බලය පවරාදීම සිදුවේ.

වර්තමානයේදීද කුලයත්, ආගමත් රාජ්‍ය බලය ලබාගැනීමේ තීරණාත්මක සාධකයන්ය. එහිදී මෙරට රාජ්‍ය ආගම බෞද්ධාගම බැවින් ප්‍රබල මතවාද ගොඩනැගීමට භික්ෂුව සමත්වේ. නූතනයේදී භික්ෂුව පෞද්ගලික ලාභ සත්කාර අපේක්ෂාවෙන් පක්ෂග්‍රාහීව කටයුතු කරන ආකාරයත්, දේශපාලනඥයා සිය බලය තහවුරු කරගැනීමටත්, බලය පවත්වාගෙන යාමටත් භික්ෂුව භාවිත කරන ආකාරයත් හඳුනාගත හැකිය. ඒ අනුව වර්තමානයේ බෞද්ධ භික්ෂුව සහ දේශපාලනඥයා අන්‍යෝන්‍ය සහයෝගය මත තම පැවැත්ම තහවුරු කරගනී. මෙම තත්ත්වය වර්තමාන දේශපාලන අරාජිකත්වයටද හේතුවකි. මේ අනුව කුලය, ධනය, ආගම සහ මතවාද බලය තහවුරු කරගැනීමටත්, බලය පවත්වාගැනීමටත් අතීතයේ මෙන්ම වර්තමානයේද භාවිත වන ආකාරය හඳුනාගත හැකිය. එහෙයින් මොහාන් රාජ් මඩවලගේ නිල්කට්රොල් කෘතිය වර්තමාන දේශපාලනයේ පිළිබිඹුවක් ලෙසද හඳුන්වාදිය හැකිය.

*නිමේෂා බණ්ඩාරනායක - රුහුණ විශ්වවිද්‍යාලය සිංහල අධ්‍යයන අංශය*

## සරදියෙල්ගේ කොලම

නන්දෙට ටික කාලයකට හෝ යන එනමං නැති විය. ඇමරිකාව විතරක් නෙමෙයි ඩුබායි, අබුඩාබි පවා වද්ද නොගන්න ගානටම හේ තෙමේ පත්වුණා. අවුරුදු පහකට පත්වෙච්ච විධායක ලොක්කෙක් දෙකහමාරෙන් කනෙන් ඇදලා දොට්ට දැම්මාමයි ඔය මයේ හිතේ මේ ඉතිහාසේ. ජනතා පරමාධිපත්‍යය කිය කිය මීට ඉස්සර පාරම්බෑවට සැබෑවටම ජනතා පරමාධිපත්‍යය කියන්නේ මොකක්ද කියලා කව්රු කව්රුත් හරියටම දැක්කේ මේ පාර තමයි. රටින් පැනලා යන්න තැනක්වත් හොයා ගන්න බැරිවුනා ඒ කයිවාරු ලොක්කන්ට.

හැබැයි ආයිබොවන්, රූකඩ ලොක්කා පැනලා ගියාට රූකඩේ නටවපු අවලස්සන ඇමරිකානු හොල්මන සහ පිරිවර වැඩේ අතෑරියෙ නෑ. ආයේ වටේකින් ඔලුව උස්සාගෙන ආවා.

සරදියෙල්ට හම්බවුණා අවුරුදු 74ක් වයස ඕලාරික පප්පෙක්. මිනිහා හරි සතුටින් තමන්ගේ පරණ තැපැල් නයින්ටිය තල්ලු කරගෙන හෙන ගැම්මෙන් යනවා. සරදියෙල් මග හරස් කරලා අන්කල්ට දැම්මා හරස් ප්‍රශ්නයක්.

"අන්කල් මොකෝ මේ තල්ලු කර ගෙන?"

"වැඩක් නෑ කොලුවෝ කියලා. බයිසිකලේට තෙල් කඳුලක් දැක්ක කාලයක් මතක නෑ. ලෝක වෙළඳපොලේ මාර වැඩිකිරිල්ලක්නේ වැඩි කරේ. ඒ මදිවට තිබ්බ පෝලිම"

"ඉතින් දැන් මොකෝ මේ අන්කල් ඉතාම සතුටින් තල්ලු කරගෙන හන්දිය පැත්තට යන්නේ."

"දැන් පෝලිම කොටයිනේ මයෙ පුතේ. බලන්නකෝ. කොච්චර දෙයක්ද?"

"ඒ උනාට අන්කල් අපි ඉස්සර කිසිම පෝලිමක් නැතුවනේ තෙල් ගැහුවේ"

"ඔය ඉතින් පුතාලාගෙ කිසිම පොසිටිව් තින්කින් එකක් නෑනේ. පෝලිම කොටයිනේ. ඒ මදෑ."

"ඒත් අන්කල් සතියටම එක පාරයිනේ දෙන්නේ. ඒකත් ලීටර් 4යිනේ"

"ඉතින් පුතේ මිලිලීටර්ම 4000ක්නේ. කොච්චර තොගයක්ද? ඒ විතරක් යෑ. අපේ ලොක්කෝ මිලත් බැස්සුවනේ. රුපියල්ම විස්සකින්ද කොහෙද අඩු කරලා නොවැ."

"ඒත් අන්කල් 117 ඉඳලා නේද 500ට විතර දඩ බඩ ගාලා නැග්ගේ. එතකොට මේක අඩුවීමක්ද?"

"ඔය ඉතින් උඹලා එක්ක බෑනේ. අයින් වෙයන් මට යන්න."

"අන්කල් අන්කල් ඊයේ පෙරේදා අන්කල්ගේ මල්ලි මැරිලා වැටුනා නේ තෙල් පෝලිමේ ඉඳලා? මං දැක්කා හොඳට ගෞරව කරලා මළ ගේ ගත්තා. ඇයි මටත් කෝල් කළේ? රෑට මළ ගෙදර ලයිට් කපනව කියලා ලීටරේ 2500ට හරි කමක් නෑ තෙල් ලීටර් 2ක් හොයා දියන් කිව්වේ. අන්තිමට ගෑස් නෑ කියලා මිනිය ආදාහනය කර ගන්නත් බැරි උනා නේ"

අන්කල් මොන මොනවදෝ මුමුණමින්, තරහින් පුපුරමින්, බයිසිකලේ දෙපැත්තට වනමින් සෙඩ් එක පැත්තට තල්ලු කරන් ගියා.

නූතන පරපුරේ සරදියෙල්.

# "අරගලයේ දෙවන රැල්ලත් නොපමාව එනවා"



*ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යමකාරක සභික*
*සමන්ත විද්‍යාරත්න සහෝදරයා*

**පසුගිය කාලය කියලා කියන්නේ ලංකාවෙ දේශපාලනයේ බොහෝ උණුසුම් සිදුවීම් ගනණාවක් එකපිට එක සිදුවුණු කාලයක්. දැන් අරගලය ඉවරද?**

අරගලයේ පළමු පරිච්ඡේදය ඉවර වුණු බව ඇත්ත. නමුත් අපි කවුරුත් මතක තියාගන්න ඕනා අරගලයේ දෙවන රැල්ලත් නොපමාව එන බව. ඒක තමයි සත්‍යය. මොකද, අරගලය පැනනැගීමට බලපාපු පීඩාකාරී හේතු දිනෙන් දිනම වර්ධනය වෙනවා. එහෙම දේශපාලනයක් තමයි දැන් රටේ නිර්මාණය වෙලා තියෙන්නේ. මිනිස්සුන්ට පීඩාව වැඩියි. දරන්න බැහැ. ඒ නිසා නැවතත් අරගලය දලු දාලා වර්ධනය වෙමින් තියෙනවා. ඒක වළක්වන්න රනිල්ට හෝ වෙන ජගතෙක්ට බැහැ. එම දෙවන අරගලය පළමු වන අරගලයට වඩා නිසි නායකත්වයක් සහිත අරගලයක් වෙනවා. නිසි වැඩපිළිවෙළක් සහිත අරගලයක් වෙනවා. ඒ අරගලය අවසන් වෙන්නෙ අනිවාර්යයෙන්ම සැබෑ ජනතා ජයග්‍රහණයක් ලබාගෙනම තමයි. ඒකට අපි සූදානම්.

**මේ ආර්ථික අර්බුදය විසින් නව දේශපාලන පෙරළියක් සඳහා ඉඩක් නිර්මාණය කරාවිද?**

රටේ පැනනැගිලා තියෙන්නෙ ආර්ථික අර්බුදයක් පමණක්ම නෙමෙයි. කොයි රටෙත් ආණ්ඩුවක් කරගෙන යනකොට සාමාන්‍යයෙන් ප්‍රධාන අර්බුද තුනක් එනවා. ආර්ථික, දේශපාලන සහ සමාජ අර්බුද ලෙස. මෙතුවක් කල් ඔය අර්බුද තුනම එක විට එනවා දැකලා නැහැනේ. ඒත් අපි දැන් මුහුණ දීලා ඉන්නෙ අර්බුද තුනම එකපාර ආපු ප්‍රබල අර්බුදයකටයි.

මේ වගේ වෙලාවක යම් යම් සුළු ප්‍රතිසංස්කරණවලින් මේ අරගල නවතින්නෙ නැහැ. මෙවැනි තත්වයක් තුළ තමයි විශාල සමාජ පරිවර්තනයක් සිදුවෙන්නෙ. ඒ කියන්නෙ සමස්ත අර්බුදයක් තුළ සමස්තයට උත්තර හොයන්න වෙනවා. ඒ නිසායි මේ අරගලය විසින් සිස්ටම් චේන්ජ් එකක්, නව දේශපාලනයක් ඉල්ලා සිටින්නේ. පැරණි දේශපාලනය දැන් අවසන් ගමන් යනවා. හරියට පහනක් නිවෙනකොට දැල්ල නටනවා වගේ ධනේශ්වර දේශපාලන කඳවුරේ දැල්ලත් නට නටා දැල්වෙනවා. නව සමාජ පරිවර්තනයක විලිරුදා කාලයක් තමයි අපි මේ පසු කරමින් ඉන්නෙ.

**පහුගිය අවුරුදු ගණනාව තුළ අපි දැක්කා, ඔබ පරිසරය සම්බන්ධයෙන් ඉතාමත්ම සංවේදීව කටයුතු කරන පුද්ගලයෙක් බව. සංවර්ධනය සහ සොබාදහම අතර ප්‍රතිවිරෝධයක් තිබෙනවාද?**

ඔව්. සංවර්ධනය වෙනකොට ස්වභාව දහමත් එක්ක යම් ගැටීමක් තිබෙනවා. කොහොමටත් ලෝකෙ කොහේ ගත්තත් මේ සමාජ ක්‍රමය දරුණු ලෙස සොබාදහමත් එක්ක ගැටෙන බව අපි දකිනවා. සොබාදහම නොතකා කටයුතු කරන ස්වභාවයක් පෙනෙනවා. ඒ තුළ අද මුළු ලෝකයම දරුණු ප්‍රතිවිපාකවලට ලක් වෙලා.

ලෝකෙ වැඩිපුරම සමුළු තියන්නෙ මොකටද කියලා බැලුවොත් ඒ පරිසර ප්‍රශ්න කතා කරගන්නයි. ලෝකය තුළ පරිසර සමතුලිතතාවය තියාගන්න, පරිසරයට කරපු හානිය පියවන්න සෑහෙන්න වියදම් කරනවා. ලෝකය දේශගුණ විපර්යාස ගැන කතා කරනවා. ඕසෝන් ස්ථරයට හානි වෙලා තියෙනවා. ඒවාට අද මිනිස්සුන්ගේ ජීවිතවලින් වන්දි ගෙවන්න සිද්ද වෙලා තියෙනවා. මුහුදු ඛාදනය නිසා සමහර රටවල් ලෝක සිතියමෙන් මැකීයන තැනකට පත්වෙලා. හුස්ම ගන්න ඔක්සිජන් ටිකත් මිලට ගන්න වෙන තත්වයක් උදා වෙලා. දරුණු ලෙස අයිස් කඳු දිය වෙමින්, උෂ්ණත්වය ඉහළ යමින් තියෙනවා. පරිසර සමතුලිතතාවය බිඳීයාම නිසා මිනිසුන් සලිත වෙන තැනකට පත් වෙලා. අද ලංකාවත් ඇවිත් තියෙන්නෙ අන්න ඒ වගේ තැනකටයි. රුපියල් සතවල ලාබය පමණක් සොයන දේශපාලනයක් තුළ පරිසරය ආරක්ෂා කරන්න බැහැ. ඒ නිසා අපි හිතන්නේ සැබෑ සංවර්ධනයකදී ඒ සංවර්ධනය පාරිසරික මිතුරු සංවර්ධනයක් වෙන්න ඕනා. මෙතෙක් මේ ලංකාවෙ පැවතුනේ පාරිසරික සතුරු සංවර්ධනයක්.

**මිනිසුන්ට මිනිසුන් ලෙස ජීවත් විය හැකි ලෝකයක් තැනීමයි අපගේ බලාපොරොත්තුව. ඔබ ඒ වෙනුවෙන් අපේ රටේ තාරුණ්‍යය වෙත කරන යෝජනාව කුමක්ද?**

ඉතිහාසය ගැන සැලකුවම සියවසක සිදුවන විපර්යාසයන් දශකයක් තුලදී සිදුවන තරමට අද ලෝකය දියුණුවට පත්වෙලා තියෙනවා. සන්නිවේදනය සහ තාක්ෂණය අතින් ලෝකය කොයිතරම් ඉහළට ගියත් රටක් විදියට අප බොහොම පසුගාමීවයි ඉන්නේ. මේ තත්වය මඟහරවන්න අපට ඉන්න හොඳම බලවේගය තමයි තරුණ බලවේගය. ඇත්තටම තාමත් අපේ රටේ තාරුණ්‍යයට නිසි තැන ලැබිලා නැහැ. අපේ තාරුණ්‍යයට බොහෝ දේ කළ හැකියි. ශක්තිය, නව දැනුම, ජවය තියෙන්නේ එතැනයි. ඒ නිසා දියුණු රටක් නිර්මාණය කරගැනීමේ හොඳ විභවයක්, හැකියාවක් තියෙන්නේ තාරුණ්‍යයටයි. ඒ සඳහා නිසි දැක්මක් එක්ක වැඩ කළොත් රටට විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් ගේන්න පුළුවන්. ඒ නිසා තරුණ ඔබෙන් ඉල්ලන්නේ රට ඉල්ලා සිටින ජයග්‍රහණ ලබා දීම සඳහා ඔබ නායකත්වය දෙන්න, පෙරමුණ ගන්න කියලයි.

The Gadget

## resapp - රෝග විනිශ්චය කරන ඇප් එක

මෙම ඇප් එක මගින් කරනු ලබන්නේ කොවිඩ් ආසාදනය වී ඇතිදැයි තහවුරු කර ගැනීමය. මෙය ක්‍රියාත්මක වන්නේ ඔබ කහින විට එම හඬ මෙම ඇප් එක මගින් විශ්ලේෂණය කර ඔබගේ රෝගය හඳුනාගැනීමයි. මේ සඳහා මෙම ඇප් එක විශේෂිත වූ (AI) කෘත්‍රිම බුද්ධියක් භාවිතා කරයි. මෙමගින් නිවැරදිව රෝග හඳුනාගන්නේද යන්න තහවුරු කරගැනීම සඳහා ඇමරිකාවේ සහ ඉන්දියාවේ රෝගීන්ව පරීක්ෂණයන්ට ගත් අතර එවිට සාර්ථකව කොවිඩ් ආසාදිත රෝගීන් හඳුනාගැනීමට මෙම රෑචච එකට හැකිවී තිබේ.

## Website downloader - ඕනිම සයිට් එකක් බාගත කරමු

ඔයාගේ අවශ්‍යතාවයට අනුව සම්පූර්ණ website එකක දත්ත save කරගැනීමට වුණොත් ඔබ මොකද කරන්නේ? ඔබට පුලුවන් ඉදදනප්රන කරගැනීමට නැතිනම් screenshoot භාවිතා කිරීමට. හැබැයි සම්පූර්ණ website එකක් screenshoot ගැනීම අපි හිතන තරම් සරල නෑ වගේම තමයි bookmark කරගැනීමත් අපි හිතන තරම් ප්‍රයෝජනවත් නැති දෙයක්. ඉතින් මේ නිසාම අපිට website downloader සයිට් එක වැදගත් වන්නේ. ඔයාට කරන්න තියෙන්නේ ඉතා සරල දෙයක් අදාල website එකේ link එක copy කරලා website downloader site එක මත ඇති search ඉදං එක මත paste කිරීම මගින් සම්පූර්ණ වෙබ් අඩවියම download කර ගත හැක. (https://websitedownloader.io/)




Gadget Video

## Kaspersky Password Manager - දුර්වල මුරපද හඳුනා ගමු

ඔබ අන්තර්ජාලය භාවිතා කරන විට එහි ඇති ඔබගේ විවිධ ගිණුම් සඳහා එකම මුරපදයක් හෝ දුර්වල මුරපද ඔබ නොදැනුවත්වම යොදනවා වෙන්න ඇති. මේ නිසාම Kaspersky Password Manager සමඟින්, ඔබට ඔබගේ මුරපද කෙතරම් ශක්තිමත්ද යන්න සහ එකම මුරපද වෙනත් ගිණුම්වල භාවිතා කරන්නේද යන්න ගැන ඉක්මණින් සොයා ගන්නට පුලුවන්.



## Pixy drone - පුද්ගලික රොබෝ ශිල්පියෙක්

ඩ්‍රෝන තාක්ෂණය සමාජ මාධ්‍ය, නාටකාගාරවල, හෙළිදරව් කිරීම්වලදී මෙන්ම විශ්මයජනක දර්ශන රූගත කිරීම සහ බොහෝ දේ සඳහා බහුලව භාවිතා කරයි. නමුත් මේ නව ඩ්‍රෝන එක අනික් ඩ්‍රෝනවලින් වෙනස් වෙන්නේ මෙය පාලන කිරීමට කිසිම දැනුමක් හෝ කිසිදු අමතර උපාංගයක් අවශ්‍ය නැති වීමයි. තවත් පැහැදිලි කරනවනම් ඡායාරූප, වීඩියෝ සඳහා මෙය පුද්ගලික රොබෝ ශිල්පියෙකු මෙන් ක්‍රියා කරයි.



## PlantsIO Ivy - කතා කරන ශාකය

PlantsIO Ivy යනු හැඟීම් ප්‍රකාශ කිරීමේ හැකියාව ඇති ඔබේ බුද්ධිමත් ශාක සහකරුයි. මෙය ඔබේ ශාකයේ යහපැවැත්ම නිරීක්ෂණය කිරීමට ඔබට සහය වීමට සංවේදක 7ක් භාවිතා කරයි. ඒ ජල මට්ටම, ආලෝකය, උෂ්ණත්වය, ස්පර්ශය, කම්පන, වායු සහ පාංශු තෙතමනය යන සංවේදකයි. මෙහි ඇති AI තාක්ෂණය මගින් විවිධ ප්‍රකාශන පෙන්වන අතර මෙම ප්‍රකාශන ඔබේ ශාකයේ සෞඛ්‍යය සහ සමස්ත යහපැවැත්මට සෘජුවම සම්බන්ධ දේවල්ය.



## කරක් ගහපු තැනක් - සුන්දර අරිසිමලේ...



කොළඹ සිට කිලෝමීටර 313ක් ද ත්‍රිකුණාමලයේ සිට කිලෝමීටර 52ක් ද, පුල්මුඩේ සිට කිලෝමීටර 3.3ක් ද පමණ දුරින් පිහිටා ඇති "අරිසිමලේ" වචනවලින් විස්තර කළ නොහැකි, දැකබලා විඳිය යුතුම අසිරිමත් සුන්දරත්වයකින් යුතු මුහුදු තීරයක් සහ කුඩා වනාන්තරයකින් හෙබි සොබා දහමේ අපූරු නිර්මාණයකි. දෙමළ භාෂාවෙන් අරිසිමලේ යන්නෙහි තේරුම වන්නේ සහල් කන්දක් යන්නයි. තවත් සමහරුන් විසින් එය "අසිරිමලේ" ලෙසින් ද හඳුන්වනු ලබන්නේ එහි ඇති සැබෑම සුන්දරත්වය සිහිගන්වමිනි. සයුරෙහි නැගෙන මනරම් රළ පෙළ උස්ව නැගෙන අතරම ගල්පරවල වැදීමෙන් නිරන්තරවම නැගෙන රළ බිඳෙන හඬ ද ගෙනෙන්නේ අපූර්ව වූ මිහිරියාවකි. නිල්වන් සයුරත් මනරම් වෙරළත් එක්ව මවන්නේ අහම්බෙන් මුණගැහෙනා පන්නයේ සොබාසිරියකි. ලංකාවේ වෙනත් කිසිඳු වෙරළක දක්නට නොලැබෙන මුහුදු වැල්ලකින් සමන්විත එහි වැලි කැට තරමක් විශාල වන අතර සහල් ඇටවන්ය. වෙරළ තීරය පුරාම විසිර ගිය සිප්පිකටු සහ බෙල්ලන්ය.

අරිසිමලෙහි ඇති ඓතිහාසික වටිනාකම නම්, තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන් මෙහි ආ ගිය බවට වන පුරාවෘත්තයයි. ලංකාවේ නැගෙනහිරට වන්නට පිහිටා ඇති මුහුදු තීරය මෙවැනි අසිරිමත් සොඳුරු දසුන්වලට ප්‍රසිද්ධියක් උසුලයි. මෙම අරිසිමලේ මුහුදු තීරයට උතුරින් ඇති කෝකිලායි මුහුදු තීරය ද දකුණින් පිහිටා ඇති නිලාවේලි මුහුදු තීරය ද මෙයට කදිම සාක්ෂි වේ. මෙම මුහුදු තීරයන් සංචාරක ආකර්ෂණය අතින් ද ඉස්තරම්ය. ජලය ඉතා පැහැදිලි වුවද මුහුද චණ්ඩය. එනයින්ම එහි බැස දිය නෑම ඉතා අනතුරුදායකය. තවත් විශේෂත්වයක් වන්නේ මෙම මුහුදු තීරය වෙත ගමන් කිරීමට නම් කුඩා වන පෙදෙසක් පසු කිරීමට සිදුවීමයි.

ඉදින් ගතසිත නිවා සනසා ගැනීමට අපූරු පාරිසරික සුන්දරත්වයක් සොයා යන ඔබට කදිම නවාතැනක් ලෙස අරිසිමලේ වෙරළ තීරය තෝරාගත හැකියි. ඔබ පිය සටහන් හැරෙන්නට කිසිවකුත් ඉතිරි නොකොට, මතකය පමණක් හිතට පුරෝගෙන එන්නේ නම් අරිසිමලේ හෙටත් සොබාසිරියෙන් හිනැහෙනු ඇති.



# මුහුදෙන් ගොඩබිමට

මෙවර කලාපයෙන් අප සාකච්ඡා කරනු ලබන්නේ සිලූරිය යුගයේ ජීවීන් පරිණාමය වූ ආකාරය පිළිබඳවය.

## සිලූරිය යුගය

**(වසර මිලියන 440කට පෙර සිට 410කට පෙර කාලය දක්වා)**

### පිහිනන්නෝ සහ පියාඹන්නෝ

ඕර්ඩොවිසිය ව්‍යසනයෙන් දිවි ගලවාගත් ජල ජීවීන් අතුරින් එක් කුඩා ජීවියෙක් සිය සිරුර තුළ නවතම උපාංගයක් වර්ධනය කර ගැනීමට මේ යුගය වන විට සමත්ව සිටියේය. එම උපාංගය නම් ප්‍රාථමික මට්ටමේ කොඳු ඇට පෙළකි. පළමුවෙන් එක් දිගු ඇටයක් ලෙස දක්නට ලැබුණු මෙම කොඳු ඇටය පසුව සත්ත්වයාගේ හැසිරීමේ පහසුව සැලසෙන පරිද්දෙන් කුඩා කොඳු ඇට පෙළක් බවට වර්ධනය විය.

කොඳු ඇට පෙළ නිසා තම සිරුර පහසුවෙන් පාලනය කර ගැනීමේ පමණක් නොව සතුරාගෙන් බේරීම පිණිස වහා වේගයෙන් පිහිනා යාමේ හැකියාවද මෙම ජීවියාට ලැබිණි. පීත්ත පටියක් වැනි සිහින් පැතලි කඳකින් යුතුව සිටි මෙම ජීවියා මිරිදියෙහි ජීවත් වූවෙකි. තවත් කලකින් මෙම ජීවියා සිය පරිණාමීය ක්‍රියාවලිය මගින් උල් තියුණු දත් සහිත මුවකින් ද, දැඩි හිස් කබලක් හා ඊට සවි වූ ඇස් දෙකකින් ද, කොඳු ඇට පෙළ හා ඊට සවි වූ ඇස්ථි රාමුවකින් ද ඒ සියල්ල ආරක්ෂා කර ගැනීම පිණිස සවිමත් කොරපොතු ආවරණයකින් ද යුතු සත්ත්වයෙකු බවට පත් විය. ජලයේ වේගයෙන් එහා මෙහා පිහිනා යාමට උචිත පරිදි සිය සිරුර හැඩගස්වා ගත් මේ ජීවියා පිළිබඳ කතා පුවත අනෙකක් නොව මාළුවාගේ අතීත කතා පුවතයි.

ඉතා ඉක්මනින් මාළුවා සිය ජලජ සමකාලිකයන්ට වඩා බොහෝ සෙයින් වර්ධනය වූ ජීවියෙකු බවට පත් විය. වේගයෙන් පිහිනා යාමට අවශ්‍ය වරල් හා වලිගය නිසා සතුරන් මගහැර පලායාමත්, අලස ලෙස ජලයේ පිහිනමින් සිටි සතුන් ගොදුරු කර ගැනීමත් ඌට ඉතා පහසු කාර්යයක් වූ බවට සැකයක් නැත. එපමණක් නොව මුහුණ ඉදිරියෙන් පිහිටා තිබුණු තියුණු උල් දත් සහිත විශාල මුඛය ඔහුට ආහාර විශාල ප්‍රමාණයක් ගැනීමට සොබාදහමේ දිනිතියන්ගෙන් ලද තවත් වැදගත් දායාදයක් විය.

වැඩි කල් ඉක්ම යන්නට පෙර මිරිදිය ජනාවාස කිරීමටත්, ඉන් අනතුරුව මහ සයුරට සංක්‍රමණ වීමටත් මාළුවා පොහොසත් විය. මත්ස්‍ය පරපුරේ ඇතැමුන් තවමත් බිත්තර ලෑම පිණිස ගංගා විල් ආදී මිරිදිය ජලයට පැමිණෙන්නේ සිය මුතුන්මිත්තන්ගේ නිජබිම් තවමත් ඔවුනට අමතක වී නොමැති හෙයින් විය යුතුය.

මේ යුගය වන විට ජීවීනට අවශ්‍ය තරම් ඔක්සිජන් ප්‍රමාණයක් වා තලයට එක් කිරීමට ක්ෂුද්‍ර ජීවීන් හා ශාක සමත්ව තිබූ හෙයින් මෙතෙක් ජීවයෙන් තොරව තිබුණු ගොඩබිම තමාවෙත එන්නැයි ජලජ ජීවීන්ට අතවනමින් සිටින්නට ඇත. ප්‍රථමයෙන් එම ඇරයුම පිළිගෙන ශාක පරපුර දැනටමත් වෙරළාශ්‍රිත ප්‍රදේශවලට සංක්‍රමණය වී තිබුණි.

එම පැළෑටි පත්‍රිකා හෝ නැටි වලින් තොර ස්වරූපයෙන් පතොක් වර්ගයේ පැළෑටි බඳු ඉතා කුඩා ඒවා විය. ඒවායේ මල් හට ගැනීමක් ද නොවීය. එහෙත් ප්‍රභාසංස්ලේෂණය මගින් සිය ආහාර නිපදවා ගැනීමටත්, එසේ නිපදවා ගත් ආහාර පැළෑටිය තුළ සංසරණය කිරීමටත් අවශ්‍ය සෛල රටා ගොඩ නගාගෙන තිබිණි.

වෙරළාශ්‍රිත ප්‍රදේශවලින් නොනැවතී මෙම ශාක පරපුර ගංගා හා ජලමාර්ග ඔස්සේ ගොඩබිම අභ්‍යන්තරයේ පහත් බිම් ප්‍රදේශවලට සංක්‍රමණය වී සිය පරපුර බෝ කළහ. නොබෝ කලකින්ම පහත් බිම් සිය ග්‍රහණයට හසු කොටගෙන ඒවා එකම ඝන රුක් ලතා ගොමුවක් බවට පත් කිරීමට මෙම ශාක සමත් වන්නට ඇත.

මෙම ශාක ගොමු විසින් පොළොව මත බිහි කරන ලද අඳුරු තෙතබරිත පරිසරය ජලයේ විසූ ඇතැම් ජීවීන්ට ගොඩබිම කරා සංක්‍රමණය වීමට අනුබලයක් වන්නට ඇත. මේ වන විට ද ඇතැම් ජලජ ජීවීහු වාතය ආශ්වාස කිරීම සඳහා අවශ්‍ය ඉන්ද්‍රියන් වර්ධනය කරගෙන සිටියහ.

දිය මකුණා මෙසේ ගොඩබිම සංක්‍රමණිකයින්ගේ පුරෝගාමියා වූ බව පෙනේ. දිය ගෝනුස්සා ද දිය මකුණා පසුපස ගොඩබිමට සේන්දු විය. වත්මන් බත්කූරාගේ මුතුන් මිත්තෝ ද සිය පියාපත් උපයෝගී කොටගෙන සැරි සැරීම ආරම්භ කළේ මෙම අවධිය අග භාගයේදීය.

සිලූරියන් යුගයේ පෘථිවි තලයේ වූ වෙනස්කම් අතුරින් කැපී පෙනෙන්නක් නම් බෝල්ටිකාව ලොරොන්තියාව දෙසට ඇදී ඒමයි. ගොන්ඩ්වානාලන්තය කෙමෙන් දක්ෂිණ ධ්‍රැවය වෙත සේන්දු විය. ඩෙවොනියන් යුගයේ කැලිඩෝනියන් කඳුවැටිය ඇති වූයේ මෙම භූමි ප්‍රදේශ එකිනෙක ගැටීම නිසා ඉහළට නෙරා ගිය භූමියෙනි. ගොඩ්වානාව හා අසල්වැසි මහද්වීපවලට මැදි වූ ප්‍රදේශය පසුකලක ටෙතීස් මුහුද බවට පත් විය.

ගොඩ්වානාලන්තයට අයත් භූමි ප්‍රදේශයෙන් වැඩිතරය තවමත් ජලයෙන් යට වී තිබිණි. ශීත දේශගුණය හේතු කොටගෙන ගොඩ්වානාලන්තය මත යෝධ හිම කඳු ගොඩනැගීම නිසා සාගර ජලමට්ටම පහත බැස තිබිණි. ගොඩබිම වූ ජලාශ රැසක් හිඳී ගියේය. මෙම ජලාශවල ජලයේ ද්‍රාවණය වී තිබුණු ලුණු, ජිප්සම් ආදී ලවණ ඝනීභවනය වී විශාල නිධි බවට පත් විය. අපි අද ඒවායින් ප්‍රයෝජන ගනිමින් සිටිමු. පාංශු ඛාදනය නිසා ද, පැළෑටිවලින් තොරවීම නිසා ද වැලිතලා හා කාන්තාර බිහිවීම ඇරඹිණි. එපමණක් නොව පාංශු ඛාදනය නිසා පහත් බිම් ප්‍රදේශවල කාබනික ද්‍රව්‍ය සහිත පස් තට්ටු ගොඩනැගෙමින් තිබුණි. මෙම පස් තට්ටු ශාක ලෝකයේ මෙන්ම සත්ත්ව ලෝකයේ ද වර්ධනයට මහත් පිටුබලයක් වූ බව නිසැකය.



# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න. අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක් FORWARD කවි පිටුවේ වෙන් කරන්න.
මෙන්න අපගේ ලිපිනය
FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com




## නුඹ සොයන මම

අතහැරුණු
හීන මැද
අත්නොහරින
හිතක්..
ඇදවැටුණු
දහස්වර
අත්නොහැරුණ
අතක්

] බුද්ධික සම්පත් - අනුරාධපුර [

## පොතේ කතාව



ළා දුඹුරු පිටු අතර
ඇවිද ගිය මිනිසුන්
ළය ගැහෙන චවුනට
මව්පියෝ වූවෝය..
ඒ ළමුන් සමහරු
මල්වරව, වියපත්ව,
කඩදාසි කොළ මත
මුණුපුරන් වැදුවෝය..
පොත් වෙලා නැවතුණු
ඒ සියළු මිනිසුන්
පෙළපත් ගණන් දරුවන්ට
ජීවිතය ගයනු ඇත..

] සඳුනි නුවන්තිකා - කොළඹ [

## උන් එක්ක නවතින්න

එකම පාටින් අපේ
හැලෙන "ලේ" දුටුවනේ..!
අපි උඹලා හන්දනේ
පොඩි එවුන් බයවුණේ..!

පොංගලේ බත කන්න
නල්ලූර් වැදගන්න
නැවුම් කිරිබත් රැගෙන
උන් ආවෙ නවතින්න

මල් මාල පලඳින්න
කෙහෙල් කිරිබත් දෙන්න
බලාගෙන අපි උන්නෙ
චන්දිරන් / හඳ එක්ක

වෘක වෙස් අර ගත්තු
උඹල අපි හින්දාම
හා පැටව් හැංගිලා
වරෙන් එක්කර එන්න....

] තිළිණි කුමානායක - කොළඹ [



## වැහි මතක

අද උදෙත් හීනියට පොද වැස්ස වැටුණා
ඉහලගෙන කුඩෙත් මං හනික පියනැඟුවා
කළබලයි නෝ ටයිම් සිත නිවනු බැරුවා
චුරු චුරුව නැවතියන් ගවුමෙ මඩ ඉහුණා

ඉස්සරම වහිනකොට ඉස්කෝලෙ කාලේ
වැස්ස එක්කයි තිබුනෙ ලෙංගතුම ආලේ
මොන කුඩද දුවමු බං කියපු වී කාලේ
අම්මගේ බැනුම් ලඟ සැනසුමයි ආලේ

පස්සෙ පහු දවස් වල වහිනකොට නියමයි
ඇඳට පනිනව වගේ යාන්තම් මතකයි
පොතක් නෑ අල්ලන්නෙ අම්ම බෙරිහන් දෙයි
ඒ වගෙද නින්දෙ සැප වැහි අඳුර සීතයි

එළඹුණේ ඊලඟට හිත් බිඳෙන සමයයි
ප්‍රේමයත් මිතුදමත් නිරන්තර රිදුණයි
වැහි වැටෙන සීතලේ ලියූ කවි එමටයි
ඒ කවිත් වැස්සේම දියවුණා මතකයි

දැන් ඉතින් මොන වැහිද හනි හනික දුවපන්
වාට්ටුවෙ වැඩ ගොඩයි හත වෙද්දි ඉඳපන්
ලෙක්චර් එක වෙලාවට ලේට් වී ගියොතින්
හාෆ් ඩේ දානවලු මෙහෙ නීති එමටයි

ඔව් සුදු අද උදෙත් හොඳටෝම වැස්සා
පාරෙ වාහන වලට ගවුමෙ මඩ ඉහුණා
කෝටියක් බැනුම් මැද හැමදාම රිදෙනා
හදවතත් පදම් වී කඳුලු වැහි හිඳුණා

අමතකව නෑ මටත් ඒ හීනි වැස්ස
ඉඳ හිටල හමුවුණත් එදාටත් වැස්ස
සීතලක් නෑ දැනුනෙ නුඹෙ රස්නෙ හුස්ම
මතක් වෙද්දිත් පපුව බරයි හරි ගැස්ම

නුඹ කොහෙද මං කොහෙද වැස්ස පායාපන
ඔය හිතට පාළුවක් එපා මං එනකම්
හමුවෙනා දවසකට වැහි වතුර උතුරන්න,
ආදරෙත් අරන් මං ඉක්මනට එන්නම්

] නුවනි කුමාරසිංහ - කුරුණෑගල [

## උඩ පැලේ කොනෙන් මෝරන හඳ යට

කෙළවරෙ ලියද්දෙන් දළ ඇතා කනකොට
වලා,හඳ වහනවා දකියිදෝ ගිනිබට
නින්දගියෙ නෑ අම්මෙ අප්පච්චි බැන්නට
ආදරේ ඇයි එහෙම තේරෙන්නෙ නෑ මට

රෑට අලි හොරු එන්නෙ පැටව් දොක්කාගෙන
අනේ හොර එලිවෙන්නෙ දඟලන්න නැතිකොට
අලි අම්ම හරි සැරයි පුතා ලඟ ඇතිකොට
අලි පියයි සෙනේබර අපි තනිය කිව්වට

තුන්පතේ කිරි අම්ම වැඩියි හැඩ මවට
තාත්තට වත් එන්න දෙන්නෙ නෑ ළඟට
නැගිටලා නාවොතින් දුර ගමන් යන්ට
එන කෙනෙක් ආවදෙන් දමල යයි යන්ට

නියපොත්ත එඩිතරයි වැටෙන්නෑ ගොයියෝ
තනි දළය දුවන් නෑ බල්ලන්ට දයියෝ
මැණිකෙ මට විතරමයි දන්නෙ නැ ගැමියෝ
පුට්ටුව කලුවරෙ මැරුණෙ ඇයි අයියෝ

මොනරු මුර කරනවා තනිය නෑ රෑම
කිරලුන්ගෙ අනාවැකි වැරදිලා නෑම
පන්දමට ඇස් දෙන්නෙ නරි හොයන කෑම
අඳුන් දිවියන්ට රජ මඟුල් රෑ වීම

කාෂ්ටකලාපෙ හුඹහට අරක්ගත්ත
දරණ දිගහරිති රෑ නයි පොළොං රොත්ත
දිව්රනව පල්ල මයෙ මැණිකෙ අත ගත්ත
පය මුලම දැවටුනත් කාල නෑ ඇත්ත

හීනි පිණි පාන්දර අනිනවා හමට
මැලේ දුම පොරවනව මදිපාඩු යන්ට
උඩ පැලෙත් පිපෙනවා නාරි මල් එමට
ලැජ්ජනැති තරු එබෙනවා ඇවිත් මුවට

පඩුපුලක් උණු වුනේ නෑ මෙදුක දැකලා
ගෙදර බුදු වැඳ සිටිම් අවසරය පතලා
එලවන්න යනව හෙට හොර රජුන් වටලා
දළ ඇතුනි දැන් යන්න නිදිමතයි රෑකලා

] උදය කුමාර - අනුරාධපුර [



# දේශපාලන බල අරගලයට මැදි වූ ඉරාකය

ඉරාකය යනු බටහිර ආසියාවේ පැරණි මෙසපොතේමියාව වේ. මෙය ලෝකයේ පැරණිතම ලේඛන, සාහිත්‍යය, විද්‍යාව, ගණිතය, නීති සහ දර්ශනයේ නිජබිම වන බැවින් ශිෂ්ටාචාරයේ තොටිල්ල ලෙසද හැඳින්වේ.

ඉරාකය 1932 දී බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ජනරජයක් බවට පත්වන අතර, සදාම් හුසේන් 1979 දී බලය ලබා ගෙන ඉතිරි සියවසේ ඉරාකය පාලනය කරන ලදී. 1980 ගණන්වල ඉරාන-ඉරාක යුද්ධය අතරතුර, කුවේට් ආක්‍රමණය, 1990-1991 දක්වා ගල්ෆ් යුද්ධය සහ 1990 ගණන්වල එක්සත් ජාතීන්ගේ අනුමැතියෙන් 2003 ඉරාකය ආක්‍රමණය කිරීමෙන් සදාම් බලයෙන් පහ කරන ලදී. 2005 දී එක්සත් ජනපදය ප්‍රමුඛ ආක්‍රමණයෙන් පසු ඉරාකයේ පළමු පූර්ණ කාලීන ආන්ඩුව සහ පාර්ලිමේන්තුව ඉරාක ජනතාවගේ ඡන්දයෙන් පත්කරගන්නා ලදී.

ඉරාකය මේ වනවිට සිටින්නේ වසර ගණනාවක දරුණුතම සහ දීර්ඝතම දේශපාලන අර්බුදයක මධ්‍යයේය. මෙම උණුසුම් ගැටුමේ කේන්ද්‍රස්ථානයේ සිටින්නේ ඉරාක දේශපාලන නසබට ජ්නැර- මොක්ටාඩා අල්-සදර් සහ අසල්වැසි ඉරානය සමඟ ශක්තිමත් බැඳීම් ඇති පක්ෂවල ප්‍රතිවාදී කණ්ඩායම්ය.

2003 එක්සත් ජනපද ආක්‍රමණයෙන් පසු බල තුලනය ඉරානයේ මාර්ගයට නැඹුරු වූ ඉරාකය තුළ, උතුර පාලනය කරන සුන්නි අරාබි සහ කුර්දි කණ්ඩායම් අතර ඇති වූ එදිරිවාදිකම් නිසා බෙදීම් තවත් වැඩි විය.

2021 ඔක්තෝම්බර් මාසයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ සිට, ඉරාකයේ දේශපාලන අර්බුදයක් පවතින අතර, ඉරාකයේ නියෝජිත කවුන්සිලයේ සාමාජිකයින්ට ස්ථාවර සභාග රජයක් පිහිටුවීමට හෝ නව ජනාධිපතිවරයෙකු තෝරා ගැනීමට නොහැකි වීමත් සමඟ මාස 10ක් තිස්සේ ජාතික දේශපාලන ක්‍රමය දේශපාලන අර්බුදයක පවතී.

ශක්තිය පෙන්වීමක් ලෙස, ෂියා පූජක සදර්ගේ ආධාරකරුවන් ජූලි 31 හා අගෝස්තු 1 දෙදින තුළ දෙවරක් රජයේ ගොඩනැගිලි සහ බටහිර තානාපති කාර්යාල පිහිටි බැග්ඩෑඩ්හි දැඩි ලෙස ශක්තිමත් කරන ලද හරිත කලාපයට කඩා වැදුණු අතර ජූලි 31 ඉරිදා පාර්ලිමේන්තුව තුළ වාඩි වී සිටියහ.

සදර්ගේ ආධාරකරුවන් නව අගමැතිවරයෙකු නම් කිරීමට එරෙහිව පෙළ ගැසෙමින් සිටින අතර, මෙම විරෝධතා ඉරාකයේ ප්‍රතිවාදී ෂියා කණ්ඩායම් සහ ඉරානය දුර සිට ක්‍රීඩා කරන බව විශ්ලේෂකයින් පවසන බලගතු හස්තය අතර ගැඹුරු දේශපාලන විරසකයක් ද නියෝජනය කරයි.

ඉරානය මෙම ගැටුමේ පාර්ශවකරුවෙකු වනු ඇති බව බැග්ඩෑඩ් විශ්වවිද්‍යාලයේ දේශපාලන මහාචාර්යවරුන් සහ දේශපාලන විචාරකයින්ගේ අදහසයි.

ඉරාකයේ දේශපාලන ක්‍රමය ආපසු හැරවිය නොහැකි බිඳවැටීමේ අද්දර සිටින අතර රට සදර් සහ ඔහුගේ ඉරානය සමඟ පෙලග ැසී සිටින ප්‍රතිවාදීන් අතර සිවිල් යුද්ධයක් කරා ගමන් කරන බව දක්නට ලැබේ. සදර් විරෝධතාකරුවන්ගේ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන ලෙස දේශපාලනඥයන්ගෙන් ඉල්ලා සිටියේ, දූෂණය සහ අයුක්තිය අවසන් කිරීමට දැන් ස්වර්ණමය අවස්ථාවක් පවතින බව පවසමිනි. විරෝධතාකරුවන්ගේ ඉල්ලීම් ඉටු නොකරන්නේ නම්, පසුව ඇති වන අවුල් සහගත තත්වයට තමාට දොස් පැවරිය නොහැකි බව සදර් අනතුරු ඇඟවීය. සදර් විප්ලවවාදියෙක් නොවේ. ඔහුට අවශ්‍ය ක්‍රමය ඉදිරියට යාමටය.

දැවැන්ත තෙල් ධනය තිබියදීත්, දුර්වල පාලනය සහ දූෂණය බලය සහ ජල කප්පාදුව, දරිද්‍රතාවය සහ විරැකියාව ඉරාකයට මෙම තත්වය ඇති කර ඇත. මේ වනවිට ණ්‍රායැපසගේ භාරකාර ආන්ඩුව කටයුතු කරන්නේ ඉරාකයේ එදිනෙදා කටයුතු සමඟ පමණක් වන අතර, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව, මිලියන 41ක ජනතාවගෙන් තුනෙන් එකක් පමණ දරිද්‍රතාවයේ ගිලී පවති. රාජ්‍ය දූෂණය සහ ඥාති සංග්‍රහය, දුර්වල ආර්ථික අපේක්ෂාවන් සහ දුර්වල රාජ්‍ය සේවා මගින් ජනතා කෝපය ඇවිලවිය. ලෝකයේ වඩාත්ම තෙල් හා ගෑස්වලින් පොහොසත් රටවලින් එකක් වන ඉරාකයට තවමත් නිතිපතා විදුලිය සැපයීමට නොහැකි වී තිබේ. තරුණයන් අතර විරැකියා අනුපාතය සියයට 40කි.

ඉරාකය මෙලෙස කැපී පෙනෙන ගැටළු ලැයිස්තුවකට මුහුණ දී සිටී. එයට ආර්ථික ප්‍රතිසංස්කරණ, ඵලදායී රාජ්‍ය සේවා සැපයීම ඇතුළත්ය. මෙම අර්බුදවලට තමන් සම්බන්ධ නැතැයි කීමට හෝ තමන්ට බලපාන්නේ නැතැයි කියා සිටීමට කිසිදු දේශපාලන පක්ෂයකට හෝ කණ්ඩායමකට නොහැකිය. සියල්ලන්ම ඇතුළත් සංවාදයක් තුළින් විසඳුම් සෙවීමේ අවශ්‍යතාව පැහැදිලිය. එසේ නොමැති විට, ඉරාක රාජ්‍යය තවදුරටත් අස්ථාවරත්වයට තුඩු දෙනු ඇත. එබැවින් දේශපාලන පාර්ශ්වකරුවන්ට තම වගකීම් භාරගෙන ජාතික අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියා කළ යුතු කාලය දැන් එළඹ ඇත.

ඉරාකයේ පවතින මෙම දේශපාලන අර්බුදය තුලින් අපට ගත හැක්කේ ඉතාමත් ඉක්මනින් ලංකාව තුළ පවතින දේශපාලන අර්බුදය විසඳාගැනීමටද පුරවැසියන් සියලුදෙනා එක්ව නැගිසිටිය යුතු බවයි. කඩිනම් මැතිවරණයකට රජයට බලපෑමක් නොකළහොත් මෙම අර්බුදය තවත් තීව්‍ර වනවා පමණක් නොව රට තව තවත් අගාදයකට යෑම වැළැක්විය නොහැකි බවයි.

ආගම බිහිවීම - 14 කොටස

පසුගිය කලාපයෙන් අප ඔබ වෙත ගෙන එනු ලැබුවේ නබිතුමාගේ මරණයත් සමඟ ඉස්ලාම් ආගමේ නායකයා වීමේ තරඟය තුළ නිර්මාණය වූ කාලිෆ් තනතුර සඳහා වූ ගැටුම්කාරී වාතාවරණයන් පිළිබඳවය.

# ඉස්ලාම් දහම තුළ කාලිෆ් තනතුර සහ අරාබි අධිරාජ්‍යය



අරාබි අධිරාජ්‍යය නිරතුරුවම ඉස්ලාම් දහමත් සමඟ ගැටග සා තබාගැනීම සඳහා ඉස්ලාම් ආගමික නායකත්වය නිරතුරුවම උත්සහයක නිරත විය. ආගමික සංස්ථාව ඉස්ලාම් දහම බිහි වූ දා සිට අද දක්වාම මෙය සිදුකරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස නබිතුමාගේ මරණයෙන් පසු ඉස්ලාම් දහමේ නායකත්වය සඳහා කාලිෆ් තනතුර නිර්මාණය වූ අතර එදා සිට අද දක්වා අරාබි අධිරාජ්‍යය කාලිෆ් තනතුර යටතේ පැවතුණි. නබිතුමාගේ අනුප්‍රාප්තිකයා වූ කාලිෆ්වරයාට ඔහුගේ පූජනීය භාවයෙන් විශාල කොටසක් උරුම විය. තෝරා පත්කිරීම් මගින් කාලිෆ් පදවියට කෙනෙක් පත්කිරීම නාම මාත්‍ර වශයෙන් රීතිය වූ නමුත්, කල් නොයවාම එම පදවිය උරුමය මත අයිති වන්නක් බවට පත්විය. ප්‍රථම කාලිෆ් පෙළපත වූ ක්‍රි.ව.750 දක්වා පැවති උමයියදු පෙළපත නියෝජනය කළේ බොහෝ විට නබිතුමාගේ ඥාතීන් නොව ඔහුගේ ධර්මය, ආගමටත් වඩා දේශපාලනික වශයෙන් පිළිගත් පිරිසකි. මෙය ඉස්ලාම් ආගමේ ඉතා වැදගත් සන්ධිස්ථානයකි. එනම් ඉස්ලාම් ආගම ආරම්භයේ සිටම මූලධර්මවාදී එකක් නොවන බවය. එකල ඉස්ලාම් ආගම භක්තිකයන් අතර අසීමිත භක්තිකයන්ට එරෙහි විය.

පර්සියානුවන් ෂියා නිකායිකයන් බවට පත්වී වැඩිකල් නොගොස් ඔවුන්ගේ බලපෑම මත කාලිෆ් පදවිය හෙබවූ උමයියදුවරු බලයෙන් පහ කරන ලදී. ඔවුන්ගේ තැන අබ්බාසිද්වරුන්ට හිමි විය. අබ්බාසිද්වරුන් පර්සියානු ඕනෑ එපාකම් නියෝජනය කළේය. මේ හේතුව නිසා අරාබියේ අගනුවර ඩැමස්කස් වලින් බෑග්ඩෑඩයට මාරු විය. අබ්බාසිද්වරුන්ට මුළු අරාබි අධිරාජ්‍යයම අයිති කරගත නොහැකි විය. උමයියදු පවුලේ සාමාජිකයෙකු සංහාරයෙන් ගැලවී ස්පාඤ්ඤයට පැන ගොස් එහි පාලකයා විය. එම නිසා ඉස්ලාමීය ස්පාඤ්ඤය සෙසු මුස්ලිම් ලෝකයෙන් වෙන්ව ගමන් කරන්නට විය.

අබ්බාසිද්වරුන්ගේ ප්‍රකට කාලිෆ්වරයා වූ හරූන් අලි රෂීඩ් (ක්‍රි.ව.809 දක්වා) අරාබි නිසොල්ලාසයේද සඳහන් චරිතයකි. ඔහුගේ රාජවාසල සුඛෝපභෝගීත්වයෙන්ද, කවිත්වයෙන්ද, පාණ්ඩිත්‍යයෙන්ද, ගීතයෙන්ද පිරිපුන් තැනක් විය. ආදායම අති විශාල විය. ඔහුගේ අධිරාජ්‍යය ජිබෝල්ටා සමුද්‍ර සන්ධියේ සිට ඉන්දු නදිය දක්වා විහිදුණි. ඔහු යන යන තැන තම පුද්ගලික වදකයාද කැටුව ගියේය. පසුව හමුදා කුමන්ත්‍රණයක් විසින් කාලිෆ්වරයාව අන්ධ කරන ලදී. අබ්බාසිද් පෙළපතේ අවසාන කාලිෆ්වරයා ක්‍රි.ව.1256 දී මෝගල් මුස්ලිම්වරුන් විසින් මරා දමන ලදී. එම මෝගල් ප්‍රහාරයෙන් බෑග්ද ඇගේ විසු ලක්ෂ 8ක ජනතාවද මරා දමන ලදී.

මුළු ඉස්ලාම් අරාබිය පුරාම විශාල ලෙස වහලුන් සිටියේය. අතරින්පතර ඉස්ලාම් අධිරාජ්‍යයට එරෙහිව වහල් කැරලිද ඇතිවිය. වෙළඳාම විශාල වශයෙන් දියුණු විය. ඊට හේතු වූයේ කාලිෆ්වරයා පෙරදිග හා අපරදිග අතර කේන්ද්‍රීය තැනක පදිංචි වී සිටීමයි. අරාබියේ තිබූ සුවිසල් ධනය නිසා චීනයේ සේදවලටත් උතුරු යුරෝපයේ සිනිඳු සත්ව ලොම් වැනි අගනා දිව්‍යවලටත් හොඳ ඉල්ලුමක් ඇතිවිය. අරාබි භාෂාව ලෝක භාෂාවක් මට්ටමට පැතිරුණු අතර ප්‍රවාහන මාර්ගද දියුණු විය. මාර්ග තැනීම අරාබීන්ට ලැබුණේ රෝමවරුන්ගේ හා පර්සියානුවන්ගෙනි. අරාබිහු පාර නඩත්තු කිරීමටද පුද්ගලයන් යෙදවිය. නමුත් කලක් යද්දී වෙනත් අධිරාජ්‍යයන්ගේ බලපෑම තුළ අරාබි අධිරාජ්‍යය කොටස් 4කට එනම් ස්පාඤ්ඤය, පර්සියාව, උතුරු අප්‍රිකාව, හා ඊජිප්තුව ලෙස බෙදී ගියේය. ස්පාඤ්ඤය පසුව මහමදිකයන් මරා දමා කතෝලික අධිරාජ්‍යයක් විය.

**ආරම්භක ඉස්ලාම් ප්‍රධානීන් (කාලිෆ්වරු)**

නබිතුමා (570-632)
අබුබකර් (632-635)
ඔමර් ඉබින් අල්ක්හටාබ් (නබිතුමාගේ බිරිඳක් වූ හෆ්සාගේ පියාය. අබුබකර්ගේ අනුගාමිකයකු විය.) (634-644)
උත්මාන් (නබිතුමාගේ දියණියන් දෙදෙනෙකු වූ රුකයියා හා උම්මි කුල්තුම්ගෙ ස්වාමි පුරුෂයාය.)(644-656)
හසන් අලිගේ පුතා (මාස කිහිපයකට)
මුවාවියාහ්
යාසීඩ් ඉබ්බන් මුවාවියාහ්
මුමාවියාහ්ගෙ පුතා
රසිදුන්
උමයියදු
අබ්බාසිද්

වමට

# ලාංකීය ආර්ථික අර්බුදය

## සරල කියවා ගැනීමකින් ඔබ්බට


ලංකාවේ ආර්ථිකය ඉතිහාසයේ මුහුණ දුන් බරපතලම අර්බුදයකට මුහුණ දී තිබේ. ඊට හේතු ලෙස ධනේශ්වර මධ්‍යම පාන්තික හා ලිබරල් බුද්ධිමතුන් මෙන්ම සාමාන්‍ය පුරවැසියන්ද කරුණු කිහිපයක් ඉදිරිපත් කරයි. කොරෝනා වසංගතය, යුක්රේන යුද්ධය, කළමනාකරණ දුර්වලතා, හොරකම් වංචා සහ දූෂණ හේතුවෙන් මෙම අර්බුදය ඇති වූ බව මොවුන්ගේ අදහසයි.

නමුත් එය යථාර්ථය සඟවා තබාගැනීමට ගොඩනගන ලද සාවද්‍ය පරාවර්තනයකි. ආර්ථිකයක් යනු නිෂ්පාදනය, හුවමාරුව, බෙදාහැරීම සහ පරිභෝජනය ඇතුළත් ක්‍රියාවලියකි. සමාජ සංවර්ධනයේ මුල් අවධියේ දී මානව සමාජයත් ආර්ථිකයත් එකට බැඳී නොතිබිණි. නමුත් ඒවා ක්‍රමක්‍රමයෙන් එකට බැඳෙන්නට විය. ආරම්භක ධනවාදී ආර්ථිකයත් ජාතික පරිපථයක් ලෙස හඳුනාගත හැකි විය.

ධනවාදය යනු සමස්ත මානව සමාජය සහ ආර්ථිකය ගෝලීය ප්‍රමාණයෙන් එකට බැඳුණු යුගයකි. එබැවින් නිෂ්පාදනය, හුවමාරුව, බෙදාහැරීම සහ පරිභෝජනය ජාතික ක්‍රියාවලියක සිට ගෝලීය ක්‍රියාවලියක් දක්වා පරිවර්තනය වී තිබේ.

එබැවින් ලාංකීය සමාජ ආර්ථික දේශපාලනයද තේරුම්ගත යුත්තේ එලෙසය. ලාංකීය ධනවාදයේ ආරම්භයම ජාතික එකක් නොවේ. වතු වැවිලි වගාව කේන්ද්‍ර කරගනිමින් වර්ධනය වූ ලාංකීය ධනවාදය කේන්ද්‍රීය ධනේශ්වර රටවල ආර්ථික උවමනාවක ඵලයකි. ලාංකීය ධනේශ්වර කර්මාන්තයේ ඒකරාශී වන ආර්ථික වටිනාකම් ජාතික ආර්ථිකය සංවර්ධනය සඳහා යෙදවීම වෙනුවට ආරම්භයේ පටන්ම ඒවා කේන්ද්‍රීය ධනපති රටවල් තුළට ඇදී ගියේය. විවිධ හැඩතල ගනිමින් වුවද තවමත් පවතින්නේ එම ස්වභාවයමය.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව සෘජු යටත්




විජිතවාදී ක්‍රමය පවත්වාගෙන යෑමට කේන්ද්‍රීය ධනපති රටවලට තවදුරටත් අපහසු විය. එබැවින් ඔවුන් අධිරාජ්‍යවාදී පැවැත්ම නව යටත්විජිතවාදී උපක්‍රමය හරහා ගෙනයෑමට ප්‍රවේශ විය.

මෙම අධිරාජ්‍යවාදී ලෝක ආර්ථික රටාව තුළ දිගින් දිගටම සිදු වූයේ කේන්ද්‍රීය ධනපති රටවල් තුළ ධනය වැඩි වැඩියෙන් ඒකරාශී වීමය. ජාත්‍යන්තර වෙළඳාම සෑමවිටම නොදියුණු දුප්පත් රටවල ධනය දියුණු රටවල් කරා ඇදීයන ආකාරයෙන් සකස් වී තිබේ.

ලෝක බලවතුන් විසින් ලෝකය පාලනය කිරීම සඳහා ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක වෙළඳ සංවිධාන ගොඩනගන ලදී. ලෝකයේ දුප්පත් ජාතීන්ට දියුණු ජාතීන්ගේ මුදල් ණය ආධාර ලබා ගැනීමට සිදු වූ අතර අවසානයේ එය ණය උගුලක් බවට පත් විය. ණය ගෙවීම සඳහාද ණය ලබා ගන්නා තත්ත්වයකට ඇද වැටෙන්නට මෙම රටවලට සිදු විය. ශ්‍රී ලංකාව මේ සඳහා හොඳම නිදර්ශනයක් වී තිබේ.

දියුණු ධනපති ආර්ථිකයන්ද චක්‍රීය අර්බුදයට යන බව මාක්ස්වාදය පෙන්වා දෙයි. ලාභ අනුපාතික බිඳවැටීම, නිෂ්පාදන අරාජිකත්වය හා අධිනිෂ්පාදනය මෙහි මූලයන්ය. නිදහස් ධනවාදය ඒකාධිකාරී ධනවාදය හරහා අධිරාජ්‍යවාදය කරා ගමන් කරන්නේ මෙම අර්බුදයෙන් ගැලවීම සඳහාය. ඒ වෙනුවෙන් මූල්‍ය ප්‍රාග්ධනය නොදියුණු රටවල ශ්‍රමය සූරාකෑමටද සම්පත් සහ අමුද්‍රව්‍ය උදුරාගැනීමටද යොදාගනී.

සාධාරණ නොවන වෙළඳාම මගින් නොදියුණු රටවල් නිපදවන භාණ්ඩ හා ද්‍රව්‍ය ඉතා අඩු මිලට මිලදී ගනිමින් දියුණු රටවල කාර්මික භාණ්ඩ වැඩි මිලට විකුණනු ලැබේ. මේ නිසා සෑම විටම නොදියුණු රටවලට ප්‍රමාණවත් වෙළෙඳ ශේෂයක් නොපවතී. දියුණු ධනපති රටවල් තම අතිරික්ත ප්‍රාග්ධනය නොදියුණු රටවල ආයෝජනය කරමින් ඉහළ ශ්‍රම සූරාකෑමේ මෙන්ම ඉඩම් සහ සම්පත් කොල්ලයේද යෙදෙන අතර ලාභය සිය මව් රටට ගෙනයයි. ණය ආධාර ලබා දෙමින් පොළී ලෙස තවත් ධනස්කන්ධයක් ඔවුන් උපයා ගනී.

ණය සහ ආධාර ලබාදීමේ දී කොන්දේසි පැනවෙන අතර එමගින් දියුණු ධනපති රටවල් නොදියුණු රටවල් තුළ තමන්ට අවශ්‍ය ආකාරයේ යටිතල පහසුකම් මෙන්ම ව්‍යවස්ථා, නීති, අණපනත් හා ව්‍යුහාත්මක වෙනස්කම් කරගනී.

දැන් ලංකාවේ අර්බුදය තුළ දක්නට ඇති ප්‍රශ්න ඉහත හේතු තුළින් පැනනගින බව හඳුනාගත හැකිය. එනම් විදෙස් සංචිත හිඳීයෑම, ණය අර්බුදය, රට තුළ නිෂ්පාදන ආර්ථිකය සංවර්ධනය නොවීම හා එය තවදුරටත් බිඳ වැටෙමින් තිබීම, නිෂ්පාදනයේ ඵල සමාජය තුළ බෙදී නොයාම සහ අසමානතාව දිගින් දිගටම වර්ධනය වීම එහි ප්‍රතිඵලයකි.

ලංකාවේ වත්මන් අර්බුදය දේශපාලනය සහ ආර්ථිකය තුළ පරීක්ෂා නොකොට කොරෝනා හෝ යුක්රේන ප්‍රශ්නය නිසා බව හෝ කළමනාකරණ ප්‍රශ්නයක් සහ පුද්ගල විශේෂතාවන්ගේ ප්‍රශ්නයක් ලෙස හෝ නැතිනම් වංචා දූෂණවලින්ම පැනනැගී එකක් ලෙස හෝ හඳුනා ගතහොත් එහි ප්‍රධාන වගඋත්තරකරුවා වන ධනේශ්වර ක්‍රමය සැඟවී යනු ඇති. එයින් ප්‍රශ්නයට පිළිතුරුද නොලැබෙනු ඇත.

එබැවින් ලංකාවේ ආර්ථික අර්බුදය වමේ දැක්මකින් තේරුම් ගැනීමේදී ඉහත කරුණු අවධාරණය කරගත යුතුය.


# ඒ මර්දනය ලෝකයට විශිෂ්ටයන් බිහිකරන ලද්දාහ!

මීට වසර 400කට පෙර යුරෝපයේ මර්දන යන්ත්‍රණය වූයේ පාප් ඇතුළු ඔහුගේ සහචරයන්ය. පල්ලියට පිටින් ගිය අධිරාජ්‍යයකු හෝ යහතින් සිටියේ නැත. පෘථිවිය පමණක් නොව සූර්යයා ඇතුළු සෞරග්‍රහ මණ්ඩලයද අවශේෂ තාරකාවන්ද භ්‍රමණය වූවා නොව පල්ලියට අනුව භ්‍රමණය කරවූවාය. පාප් සහ ඔහුගේ සහචරයන්ට එරෙහිව ගිය මිනිසුන්ව මහේශාක්‍ය නුවරවල මැද පණපිටින් ගිනි තැබූ යුගයකි එය. කෲරත්වය කෙබඳුදයත් පළමු වැනි එවුජින් පාප් තමන්ට එරෙහි වූ ෆ්ලෝරන්ස් නම් පොලිස් ලොක්කාගේ හිස තමා අතින්ම සිඳ දැම්මේය.

එසේවතුදු ඉතිහාසකරුවන් එයට කීවේ පුනර්ජීවනයේ යුගය ලෙසයි. උයන්වතු තලා පොඩිකර දැමුවද මල් පිපෙන්නාක් මෙන් පල්ලියේ මිථ්‍යා මතයන්ට එරෙහිව විද්‍යාවේ අසමසම දරුවන්ද, ඒකාකාරීත්වයේ නීරස පවුල් සංස්ථාවලින් පිටමන් වෙමින් හා කන්‍යාරාමවල ප්‍රාකාරවලින්ද ධනකුවේරන්ගේ ගණිකා මඩම්වලින්ද යුරෝපීය ගැහැණු එළියට ආ යුගය එය විය.

එකල යමෙකු කලාකරුවෙක් වූයේද හේ විද්‍යාඥයෙකුද විය. හේ විද්‍යාඥයෙකු වී නම් මහා නිර්මාණකරුවෙකුද විය. නැතහොත් විශිෂ්ටතම ශිල්පියෙක් විය. එකල නිකලස් කොපර්නිකස් හෝ ගැලීලියෝ නොසිටින්නට ඉර, හඳ සහ තාරකාවල රහස් මෙන්ම ඒවායේ නිවැරදිම හැසිරීම පවා දැනගන්නට පෘථිවියට තවත් වසර ගණනාවක් ගතවීමට තිබුණේය. මිනිසා අභ්‍යවකාශ යුගයට පැමිණියද අපට මොනාලීසාගේ වැනි දෑසක් දැකගන්නට සැලස්වීමට ලියනාඩෝ ඩාවින්චි එහි සිටියේය. වතිකානුවේ සුදුමැලි බිත්ති විශ්ව නිර්මාණයක් බවට පත්කළ මයිකල් ආන්ජලෝ හා මැටි පිඩකට පණ දීමට සමත් මහා ප්‍රතිමාකරු මෙසර් වින්තෝරියෝ ඒ යුගය වර්ණවත් කළෝය.

එම ශ්‍රේෂ්ඨයින් අතර මිගෙල්ද සර්වෙත් නැමති මිනිසාද විය. යන්තම් වයස අවුරුදු 15 දී ඔහු ස්පාඤ්ඤය හැර ගොස් ප්‍රංශයේ නීතිය හැදෑරූ අතර පසුව දේවධර්මය පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ෆ්‍රැන්සිස්කන් ෆ්‍රියර් ජුවාන් ද ක්වින්ටනාගේ ලේකම්වරයා ලෙස සේවය කර පස්වන චාල්ස් අධිරාජ්‍යයාගේ උපදේශකයෙකු විය. එහිදී ඔහු, පාප් පදවියේ සුඛෝපභෝගීත්වය හා දූෂණයන් දැක කම්පනයට පත් විය. පසුව හීබෲ සහ ග්‍රීක භාෂාවෙන් බයිබලය අධ්‍යයනය කරද්දී, ලතින් භාෂාව සඳහා නිල පරිවර්තනය සිදුකිරීමේදී ධර්මය විකෘති කර ඇති බව ඒත්තු ගත්තේය. 1531 දී, ඔහු සිය පළමු පොත වන




ඩි ට්‍රිනිටේටිස් එරෝරිබස් කෘතිය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව පල්ලිය මඟින් ඔහුව මිත්‍යාද-ෘෂ්ටිකයෙක් ලෙස නම් කරන ලදී. පසුව ඔහු තමන්ගේ වාසගම වෙනස් කොට රහසිගතව පැරීසියට ගොස් එහිදී ගණිතය සහ තාරකා විද්‍යාවද වෛද්‍ය විද්‍යාවද හැදෑරීය.



හේ මිනිස් ශරීරයේ ආත්මය රුධිරය බවත් එය එකවර රුධිර නාලිකා මගින් හෘදය වස්තුව වෙත නොගොස් පෙණහලුවලින් අම්ලකර වායුව රැගෙන හදවතට පොම්ප කරන බවත් හදවතේ කෝෂිකා දෙක අතරේ විවරයක් නැති බවත් සොයාගත් ලොව පළමුවැන්නාය. එකල එය භයානක අදහසක් මෙන් විය. එහෙයින් පල්ලිය සිය මිත්‍යාදෘෂ්ටිකයා සොයා යුරෝපය පුරා ලුහුබැන්දේය.

අවසන මිගෙල්ද සර්වෙත් ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවරදී පල්ලියේ වධකයන්ට කොටුවිය. ජිනීවා නුවර මධ්‍යයේ ගිනි මැලයක් මත කොටන් ඇතිරූ වධකයෝ ඒ මත මේ මිනිසාව ඔහුම ප්‍රකාශයට පත් කළ පොතේ පිටපතක් අත්දෙකේ තබා බැඳ පණ පිටින් පිළිස්සූහ. ඔහුගේ කටුක වේදනාව දීර්ඝ කරවනු පිණිස ගිනිමැලයට අමු දර යොදාගත් අතර ඔහු තෙවරක් බාගෙට පිළිස්සෙමින් නැවත නැවතත් දැල්වමින් කෲරතර මරණයක් අත්වින්දේය. එහෙත් මර්දනය කෙතරම් දැඩි වුවද මිගෙල්ද සර්වෙත් වැනි විශිෂ්ටයන්ගේ බිහි වීම කිසිදා නතර නොවීය.

# ආදර්ශයේ පරමාදර්ශී මිනිසා චේ



අර්නස්ටෝ චේ ගෙවාරා ද ලා සර්නා 1928 ජුනි 14 වැනිදා ආජන්ටිනාවේ රොසරියෝහිදී උපත ලැබුවේය. ඔහුගේ පියා අයර්ලන්ත පරපුරකින් පැවත ආ සිවිල් ඉංජිනේරුවෙක් වූ අතර මව සිසිලියා ද ලා සර්නා ස්පාඤ්ඤ සම්භවයක් සහිත කාන්තාවක් වූවාය. ඔවුන්ගේ පවුල වාමාංශික නැඹුරුතාවයක් සහිත මධ්‍යම පාන්තික පවුලක් විය. ගෙවාරාවරුන් නිදහස් සිතුම් පැතුම් ඇත්තෝ වූහ. ඔහු ජොසේ මාටිව ගරුත්වයෙන් සැලකූ අතර ස්පාඤ්ඤ සිවිල් යුද්ධයේදී රිපබ්ලිකන්වරුන්ගේ පාර්ශ්වයට අයත් වූහ. පවුලේ දරුවන් පස් දෙනාගෙන් වැඩිමලා වූයේ චේ ය. ඔහු කුඩා කල පටන්ම අභියෝගවලට මුහුණ දීමට මෙන්ම බොහෝ අන්තරායකාරී ක්‍රියාවල නිරත වීමට ද ප්‍රිය කළේය.

අර්නස්ටෝ, කොර්ඩොබාවෙ උසස් විදුහලක ඉගෙන ගත් අතර ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස් විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා ගත්තේය. අනතුරුව ඔහු ලතින් ඇමරිකාව පුරාම සැරිසරමින් පීඩිත ජනතාව වෙනුවෙන් තම තරුණ විය කැප කළේය. 1954 දී කියුබානු විප්ලවයට සහභාගී වීම සඳහා ෆිදෙල් ඇතුළු පිරිස සමඟ ග්‍රැන්මා යාත්‍රාවේ නැගී මෙක්සිකෝවේ සිට කියුබාවට ගිය චේ කියුබාව තුළ සමාජවාදය ජයග්‍රහණය කරවීම උදෙසා අප්‍රමාණ කාර්යභාරයක් සිදු කළ විප්ලවවාදියෙක් විය. එතැනින් නොනැවතුණු ඔහු බොලිවියාවේ විප්ලවය සඳහා ද සහභාගී විය. එහෙත් බොලිවියානු විප්ලවය ජය ගැනීමට චේ ඇතුළු පිරිසට නොහැකි විය. ඔහු 1967 ඔක්තෝම්බර් 09 වැනි දින බොලිවියානු භූමියේ දී ලෝක සමාජවාදය වෙනුවෙන් තම ජීවිතය පුද දුන්නේය.

ලෝක වමේ ව්‍යාපාරය සඳහා ඔහු ලබාදුන් ආදර්ශයන් බොහෝය. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ වාමාංශික ව්‍යාපාරවල පරමාදර්ශී සටන්කරුවා බවට චේ පත් විය. ඔහුගේ පුද්ගල චරිතය හා වීරත්වය තුළින් ලෝකයට නව උත්තේජනයක් සැපයීය. ධනවාදී මාධ්‍යයන්ට පවා චේව මගහැර යා නොහැකි වූ අතර ටයිම් සඟරාව විසින් විසිවන සියවසේ වඩාත්ම බලපෑම් සහගත මිනිසුන් සිය දෙනා අතරට ද ඔහුව නම් කරන ලදී.

ඔහු බොහෝ හැකියාවන්ගෙන් පිරුණු මිනිසෙක් විය. වෛද්‍යවරයෙක්, රාජ්‍ය තාන්ත්‍රිකයෙක්, උපාය සැලසුම්කරුවෙක්, ලේඛකයෙක්, ප්‍රකට සටන්කරුවෙක් මෙන්ම වරෙක කම්කරුවෙක්ද වූ මේ මිනිසා සැබැවින්ම සොඳුරු විප්ලවවාදියෙක්ම විය.

ඔහු අදහාගත නොහැකි තරමට වෘත්තීයමය විය. ඔහු තමන් කරන ඕනෑම කටයුත්තක පරම අවසානයක් දැකීමේ පිපාසයෙන් පෙළුණේය. ජනතාව වෙනුවෙන් වැඩ කිරීම මිනිසෙකුට ලැබිය හැකි උපරිම සතුට බව ඔහු දැඩිව විශ්වාස කළේය. අදටත් ඕනෑම තැනක විප්ලවයක් සිදු වේ නම් ඔහු පිළිබඳ මතකය මගහැර යා නොහැකි තරමට ප්‍රබලය.

ඉඳින් චේ යනු කල්පයක් ගියත් විකල්පයක් නොමැති සදාකාලික තාරුණ්‍යයේ සංකේතයයි. ඔහු විප්ලවයේ නොනිමි තරුවයි. ආදර්ශයේ පරමාදර්ශී මිනිසා ඔහුයි.

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.